18155

සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது.]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2013 (2014)


# (02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා

පැ තුනයි

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල
භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

....................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II කොටස්වලින් සමන්විත පිටු 06 කින් හා ප්‍රශ්න 40 කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම ද II කොටසේ ප්‍රශ්න සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය
සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 9 | |
| 3 | 10 - 20 | |
| 4 | 21 - 31 (ii) | |
| 5 | 31(iii) - 34 (ii) | |
| 6 | 34 (iii) - 40 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

(iii) ශ්‍රී ලංකා රජය මගින් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති උපාය මාර්ග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

35. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් ද්විතීයික හෝ තෘතීයික මට්ටමට වඩා ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපන සංවර්ධනය සඳහා වැඩි වශයෙන් මුදල් ආයෝජනය කළ යුතු බව යුනෙස්කෝ වාර්තාවක සඳහන් වේ.

(i) සෙසු මට්ටම්වලදීට වඩා ප්‍රාථමික මට්ටමේ දී අධ්‍යාපන සංවර්ධනය සඳහා වැඩි වශයෙන් අඛණ්ඩව මුදල් ආයෝජනය කිරීම ශ්‍රී ලංකාව වැනි රටකට වැදගත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(ii) ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපන සංවර්ධනයට යොදවනු ලබන ආයෝජන මගින් අත්කර ගත හැකි සමාජයීය ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(iii) ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපන සංවර්ධනය සඳහා මෑත කාලය තුළ දී ශ්‍රී ලංකා රජය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

*(ලකුණු 06 × 5 = 30 යි)*

## II කොටස

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, සපයනු ලබන කඩදාසිවල ලියන්න.

36. ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික රටාව තුළ මාධ්‍ය මගින් සිදු කෙරෙන අධිප්‍රචාරණ ක්‍රියාවලිය, සමාජයීය මෙන්ම ආර්ථිකමය වශයෙන් ද අහිතකර බලපෑම් ඇති කරයි.
එම බලපෑම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළහැකි ඵලදායි ක්‍රියාමාර්ග හතරක් විමසන්න. *(ලකුණු 08 යි)*

37. මානව සංවර්ධන දර්ශකය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ (UNDP) මගින් ප්‍රකාශිත නවතම වාර්තාවලට අනුව, ශ්‍රී ලංකාව රටවල් 187 ක් අතුරින් 73 වන ස්ථානය අත්පත් කරගෙන සිටී.
ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය තව දුරටත් ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග හතරක් විභාග කරන්න. *(ලකුණු 08 යි)*

38. ඉපැරණි සංස්කෘතියකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ තරුණ පරපුර වර්තමානයේ බටහිර සංස්කෘතියේ බලපෑම් හේතුකොට ගෙන සංස්කෘතික ගැටුමකට මුහුණ දී සිටී.
මෙම තත්ත්වයෙන් වත්මන් ශ්‍රී ලාංකික තරුණ පරපුර මුදවා ගැනීම සඳහා යොදා ගත හැකි පිළියම් හතරක් විභාග කරන්න. *(ලකුණු 08 යි)*

39. ශ්‍රී ලංකාවේ වත්මන් සමාජ හා දේශපාලන ගැටලුවලට පිළියමක් වශයෙන් දැනට ක්‍රියාත්මක වන 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළයුතු බවට සමාජ කතිකාවතක් ඇතිවී තිබේ.
වත්මන් සමාජයීය හා දේශපාලනමය ගැටලුවලට පිළියමක් වශයෙන් සම්පාදනය කරනු ලබන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කිරීම සඳහා යෝජනා හතරක් හේතු සාධක සහිතව ඉදිරිපත් කරන්න. *(ලකුණු 08 යි)*

40. පසුගිය දශක කිහිපය තුළ ආර්ථික ගෝලීයකරණ ක්‍රියාවලිය සිදුවූ මට්ටමට සමගාමී මට්ටමකින් මෙරට සමාජ ගෝලීයකරණය (Social Globalization) සිදුනොවීම, වර්තමානයේ ශ්‍රී ලංකාවට මුහුණදීමට සිදුවී ඇති ඇතැම් සමාජ අර්බුදවලට මූලික හේතුව වී තිබේ.
මෙම තත්ත්වයට සාර්ථකව මුහුණදීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් විභාග කරන්න.
*(ලකුණු 08 යි)*

* * *

## I කොටස

- අංක **1** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.**

1. වර්ෂ 1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා මගින් පිහිටුවනු ලැබූ ලංකා සිවිල් සේවය අහෝසි කොට, ඒ වෙනුවට වර්තමාන ශ්‍රී ලංකා පරිපාලන සේවය ස්ථාපනය කරන ලද්දේ කුමන වර්ෂයේ දී ද?

   (1) 1956 (2) 1960 (3) 1963 (4) 1972 (.........)

2. ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ලෝක උරුම වශයෙන් යුනෙස්කෝ සංවිධානය මගින් ප්‍රකාශිත ස්ථාන හතරක් නිවැරදිව දක්වා ඇත්තේ පහත කවරක ද?

   (1) සීගිරිය, රන්ගිරි දඹුලු විහාරය, දළදා මාළිගාව, ගාලු කොටුව
   (2) සීගිරිය, මාතලේ අළුවිහාරය, ඇම්බැක්කේ දේවාලය, කතරගම
   (3) මාතලේ අළුවිහාරය, සිංහරාජ වනාන්තරය, ගාලු කොටුව, කතරගම
   (4) රන්ගිරි දඹුලු විහාරය, ඇම්බැක්කේ දේවාලය, සිංහරාජ වනාන්තරය, දළදා මාළිගාව (.........)

3. ශ්‍රී ලංකාවේ ප්‍රථම ගොවි ජනපද ව්‍යාපාරය මින් කුමක් ද?

   (1) ගල්ඔය (2) මිණිපේ (3) මින්නේරිය (4) ගිරිතලේ (.........)

4. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, ජනාධිපති ධුරයේ කටයුතු කරමින් සිටින තැනැත්තෙකුට නව ජනාධිපතිවරණයක් කැඳවීම සඳහා සම්පූර්ණ කළ යුතු අවම නිල කාල සීමාව අවුරුදු කීය ද?

   (1) 3 (2) 4 (3) 5 (4) 6 (.........)

5. නොබෝදා ශ්‍රී ලංකාවේ ප්‍රථම පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විවෘත කරන ලද්දේ මින් කුමන ප්‍රදේශයේ ද?

   (1) ඇඹිලිපිටිය (2) මල්වාන (3) බිබිල (4) හොරණ (.........)

6. මෙරට සමස්ත විදුලිබල නිෂ්පාදනය සඳහා ජලවිදුලි බලයෙන් ලැබෙන දායකත්වය පහළ මට්ටමක පැවැතීමට හේතුවක් ලෙස සැලකිය නොහැක්කේ පහත කවරක් ද?

   (1) දේශගුණික විපර්යාස හේතුවෙන් ජලාශවල රඳවාගනු ලබන ජල පරිමාව අඩුවීම
   (2) විකල්ප බලශක්ති භාවිතයෙන් නිපදවනු ලබන විදුලිබල ප්‍රමාණය ඉහළයාම
   (3) ජලවිදුලි බලාගාර හා පෝෂක ප්‍රදේශ නිසි පරිදි නඩත්තු නොකිරීම
   (4) පවතින ජලවිදුලි බලශක්ති ප්‍රභව උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන තිබීම (.........)

7. වර්ෂ 2013 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේදී වැඩිම විදේශ විනිමයක් වැය කිරීමට සිදුවන භාණ්ඩ වර්ග හතර අවරෝහණ අනුපිළිවෙළින් නිවැරදිව දැක්වෙන්නේ පහත කවරක ද?

   (1) ඉන්ධන, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ආහාර හා පාන වර්ග
   (2) ඉන්ධන, ආහාර හා පාන වර්ග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග
   (3) ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ආහාර හා පාන වර්ග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ
   (4) ඉන්ධන, ආහාර හා පාන වර්ග, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ (.........)

8. පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් වන පැමිණිලි ඉදිරිපත් කළ හැකි ශ්‍රී ලංකා ටෙලිකොම් ක්ෂණික දුරකථන ඇමතුම් අංකය මින් කුමක් ද?

   (1) 1919 (2) 1929 (3) 1967 (4) 1977 (.........)

9. සාර්ක් කලාපීය රටවල මුදල් ඒකක අතුරින්, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව වැඩිම විනිමය අගයක් සහිත මුදල් ඒකකය ඇත්තේ මින් කුමන රටට ද?

   (1) නේපාලය (2) භූතානය (3) මාලදිවයින (4) ඉන්දියාව (.........)

[ 3 වැනි පිටුව බලන්න.

(iii) මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන අතීත අත්දැකීම් පාදක කොට ගනිමින්, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේදී මුහුණදීමට සිදුවිය හැකි ගැටලු දෙකක් දක්වන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

32. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ අපනයන ආදායමේ වර්ධනයක් සිදුවී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා පෙන්වා දෙයි.

(i) 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ඉහළයාමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(ii) 2012 වර්ෂයේදී මෙරට අපනයන ආදායම අඩු මට්ටමක පැවැතීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(iii) ශ්‍රී ලංකාවේ අපනයන ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

33. වර්තමානයේ මෙරට ආර්ථික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමුඛස්ථානයේලා සලකනු ලබන අතර, මේ වන විටත් ඒ සඳහා අතිවිශාල මුදල් සම්භාරයක් වැය කොට ඇත.

(i) යටිතල පහසුකම් ගණයට අයත් වන්නේ යැයි සැලකිය හැකි ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(ii) මෙරට ආර්ථික සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමුඛස්ථානයේලා සැලකීමට හේතුවිය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(iii) මූල්‍ය දුෂ්කරතා හැරුණුවිට මෙරට යටිතල පහසුකම් සංවර්ධනයේදී මුහුණදීමට සිදුවිය හැකි වෙනත් දුෂ්කරතා දෙකක් දක්වන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

34. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, වර්තමානයේ ශ්‍රී ලංකාවට විදේශ විනිමය ඉපැයිය හැකි රැකියා උත්පාදන ක්ෂේත්‍රයක් බවට පත්වෙමින් තිබේ.

(i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කොටගෙන ශ්‍රී ලංකාවේ බිහිවී ඇති විදේශ විනිමය විශාල ලෙස ලබාදෙන නවතම රැකියා ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වෙළෙඳ ක්ෂේත්‍රවල වර්ධනයට දායකවන ආකාර දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

10. පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාව (COPE) සම්බන්ධයෙන් වන සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
(1) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල වාර්ෂික ගිණුම් විමර්ශනයට ලක් කරනු ලබයි.
(2) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සිදුවන වංචා හා දූෂණ සම්බන්ධයෙන් නීතිමය වශයෙන් කටයුතු කරයි.
(3) ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වේ.
(4) පාර්ලිමේන්තු සැසිවාරයක් අවසන් වන සෑම අවස්ථාවකදී ම නිල කාලය අවසන් වේ. (.........)

11. මූලික අධ්‍යයන ආයතනය (Institute of Fundamental Studies) පිහිටුවා ඇති නගරය කුමක් ද?
(1) කොළඹ (2) මහනුවර (3) කුරුණෑගල (4) අනුරාධපුර (.........)

12. වත්මන් ශ්‍රී ලංකාවේ අවම ජනගහනයක් සහිත දිස්ත්‍රික්කය මින් කුමක් ද?
(1) කිලිනොච්චිය (2) මුලතිව් (3) මන්නාරම (4) වවුනියාව (.........)

13. නිවැරදි සම්බන්ධතාවක් නොවන්නේ මින් කුමක් ද?
(1) ආතර් සී. ක්ලාක් - ඉංජිනේරු තාක්ෂණය
(2) සේනක බිබිලේ - ජාතික ඖෂධ ප්‍රතිපත්තිය
(3) ජෙෆ්රි බාවා - ගෘහ නිර්මාණ ශිල්පය
(4) එන්.ඒ.එස්. කුලසිංහ - කොන්ක්‍රීට් තාක්ෂණය (.........)

14. ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයේ වැඩිම ටෙස්ට් ද්විත්ව ශතකලාභියා මින් කවරෙක් ද?
(1) අරවින්ද ද සිල්වා (2) සනත් ජයසූරිය
(3) මහේල ජයවර්ධන (4) කුමාර් සංගක්කාර (.........)

15. වෘත්තීය තාක්ෂණ ඩිප්ලෝමා හා උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද විශ්ව විද්‍යාලය පිහිටුවා ඇත්තේ කොහේ ද?
(1) බදුල්ල (2) බෙලිහුල්ඔය
(3) මොරටුව (4) රත්මලාන (.........)

16. පිලිපීනයේ "මැග්සයිසේ" සම්මානයෙන් පිදුම් ලැබූ ශ්‍රී ලාංකිකයින් තිදෙනෙකු නිවැරදිව දක්වා ඇත්තේ පහත කවරක ද?
(1) එදිරිවීර සරත්චන්ද්‍ර, ප්‍රේමසිරි කේමදාස, දොන් පීටර් පිල්ලේ පියතුමා
(2) ඒ.ටී. ආරියරත්න, ඩබ්ලිව්.ඩී. අමරදේව, මර්සලීන් ජයකොඩි පියතුමා
(3) ලෙස්ටර් ජේම්ස් පීරිස්, ආතර් සී. ක්ලාක්, චන්ද්‍රා වික්‍රමසිංහ
(4) එල්.ටී.පී. මංජුශ්‍රී, සිරිල් පොන්නම්පෙරුම, ගුණපාල මලලසේකර (.........)

17. මහවැලි සංවර්ධන ව්‍යාපෘතියට අයත් ප්‍රධාන ජලාශ පමණක් ඇතුළත් කාණ්ඩය මින් කුමක් ද?
(1) වික්ටෝරියා, කොත්මලේ, රන්දෙනිගල, මාදුරු ඔය, මොරගහකන්ද
(2) වික්ටෝරියා, කොත්මලේ, ලුනුගම්වෙහෙර, මාදුරු ඔය, මොරගහකන්ද
(3) වික්ටෝරියා, ලක්ෂපාන, රන්දෙනිගල, මාදුරු ඔය, මොරගහකන්ද
(4) වික්ටෝරියා, රන්දෙනිගල, ඉගිනිමිටිය, මාදුරු ඔය, මොරගහකන්ද (.........)

18. 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් පිරිසක් පැමිණි රට කුමක් ද?
(1) එක්සත් රාජධානිය (2) චීනය
(3) ඉන්දියාව (4) ජර්මනිය (.........)

19. ශ්‍රී ලංකාවේ රෝග විකාශනය මෑතකාලීනව බෝවන රෝගවල සිට බෝනොවන රෝග කරා ශීඝ්‍රයෙන් පරිවර්තනයවීමට හේතුවක් නොවන්නේ මින් කුමක් ද?
(1) වියපත් ජනගහනය ඉහළයාම (2) නාගරීකරණය
(3) පුද්ගල ජීවන රටා වෙනස්වීම (4) සෞඛ්‍ය පුරුදු අවභාවිතය (.........)

20. පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයන්ට විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් ස්ථාපිත කර ඇති සේවක අර්ථසාධක අරමුදලෙහි සියලුම පරිපාලන බලතල පැවරී ඇත්තේ මින් කවරකුට ද?
(1) මහ බැංකු අධිපති (2) කම්කරු කොමසාරිස්
(3) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් (4) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් (.........)

*(ලකුණු 01 × 20 = 20 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

18155

● අංක **21** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත්** ඉර මත ලියන්න.

21. සමස්ත ශ්‍රී ලංකාවේ හා එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා සංයුක්ත දර්ශකයක් වශයෙන් 2008 වසරේදී "ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය (Sri Lanka Prosperity Index)" හඳුන්වා දෙන ලද්දේ කුමන ආයතනය මගින් ද?

.....................................................................................................

22. ශ්‍රී ලංකා නව නිපදවන්නන්ගේ කොමිසම අයත් වන්නේ කුමන අමාත්‍යාංශයට ද?

.....................................................................................................

23. ග්‍රීසියේ පාතිනොන් දේවස්ථානයේ ගෘහ නිර්මාණ සැලැස්මට අනුව මෙරට ඉදිකර ඇති සුප්‍රසිද්ධ ගොඩනැගිල්ල කුමක් ද?

.....................................................................................................

24. වත්මන්හි ශ්‍රී ලංකාවේ උද්ධමන මට්ටම මැන බැලීම සඳහා යොදාගනු ලබන දර්ශකය කුමක් ද?

.....................................................................................................

25. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි ඒකාබද්ධ කොට මෑතකදී පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුව කුමක් ද?

.....................................................................................................

26. ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් රෙගුලාසිවලට අනුව, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මගින්ම පවත්වාගෙන යායුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතිකය (**Minimum** Capital Adequacy Ratio) සියයට කීය ද?

.....................................................................................................

27. ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් වන පැමිණිලි විභාග කිරීමේ අධිකරණමය බලය හිමිව ඇත්තේ මෙරට කුමන අධිකරණයට ද?

.....................................................................................................

28. 2014 ග්ලාස්ගෝහි පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලංකාවට රිදී පදක්කමක් හිමි කර ගැනීමට හැකි වූයේ කුමන තරග ඉසව්වක් සඳහා ද?

.....................................................................................................

29. ශ්‍රී ලංකාවේ ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතිකය ගණනය කිරීම සඳහා තොරතුරු ලබාගන්නා පුද්ගලයන් අයත් වන වයස් කාණ්ඩය කුමක් ද?

.....................................................................................................

30. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ මෙරට පළමු පාර්ලිමේන්තු මහ මැතිවරණය පවත්වන ලද්දේ කුමන වර්ෂයේ දී ද?

.....................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත්** ඉර මත කෙටියෙන් ලියන්න.

31. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනතා පරමාධිපත්‍යය තහවුරු කිරීම සඳහා ඊට පෙර තිබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට වඩා වැඩි ඉඩ ප්‍රස්ථා සලසා ඇති බව ඇතැම් ආණ්ඩුක්‍රම විශාරදයෝ ප්‍රකාශ කරති.

(i) ශ්‍රී ලංකාව වැනි ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහයක් සහිත රටක ජනතා පරමාධිපත්‍යය තහවුරු කිරීම වඩාත් වැදගත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) .....................................................................................

(ආ) .....................................................................................

(ii) 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනතා පරමාධිපත්‍යය තහවුරු කිරීම සඳහා සලසා ඇති විධිවිධාන දෙකක් දක්වන්න.

(අ) .....................................................................................

(ආ) .....................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

18155

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ

විවෘත තරග විභාගය - 2013 (2014)


# (03) ගෝලීය ප්‍රවණතා

පැ. තුනයි

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



* පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

..............................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

..............................

වැදගත් :

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II කොටස්වලින් සමන්විත පිටු 06 කින් හා ප්‍රශ්න 40 කින් යුක්ත වේ.
* පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
* I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම ද II කොටසේ ප්‍රශ්න සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.
* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.
* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
* අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 12 | |
| 3 | 13 - 20 | |
| 4 | 21 - 31 (ii) | |
| 5 | 31(iii) - 34 (ii) | |
| 6 | 34 (iii) - 40 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානය වඩාත් ඵලදායී සංවිධානයක් බවට පත්කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කරන්න.

(අ) ..........

(ආ) ..........

35. අමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි නාසා (NASA) හෙවත් ජාතික ගුවන් ගමන් හා අභ්‍යාවකාශ පරිපාලන ආයතනය ලොව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරනු ලබන ආයතනයකි.

(i) නාසා ආයතනය පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(ii) නාසා ආයතනය මගින් අත්කරගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(iii) නාසා ආයතනයට මුහුණ දීමට සිදුවිය හැකි අනාගත අභියෝග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

*(ලකුණු 06 × 5 = 30 යි)*

## II කොටස

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, සපයනු ලබන කඩදාසිවල ලියන්න.

36. "හරිතාගාර වායු පරිසරයට මුදාහැරීම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ දී සංවර්ධිත රටවල් විසින් වැඩි වගකීමක් දැරිය යුතු වේ."
වර්තමාන ගෝලීය තත්ත්වය යටතේ මෙම ප්‍රකාශය කොතෙක් දුරට ගැළපේ දැයි නිදසුන් සහිතව විමසන්න.
*(ලකුණු 08 යි)*

37. වර්තමානයේ දී බ්‍රික්ස් (BRICS) සංවිධානයට දේශපාලන හා ආර්ථික වශයෙන් මුහුණ දීමට සිදුවී ඇති අභියෝග හතරක් නිදසුන් සහිතව විමසන්න. *(ලකුණු 08 යි)*

38. "සමූහ නිෂ්පාදනය වෙනුවට සමූහයා සඳහා නිෂ්පාදනය කළ යුතුය. (Instead of mass production, production for masses)" යන්න මහත්මා ගාන්ධිතුමාගේ සංකල්පයකි.
මෙම සංකල්පය වර්තමානයට කොතෙක් දුරට අදාළ කරගත හැකිදැයි කරුණු හතරක් ඔස්සේ විභාග කරන්න.
*(ලකුණු 08 යි)*

39. "බටහිර රටවල් විසින් සිය අරමුණු සාක්ෂාත්කරණය සඳහා ලෝක ජනමාධ්‍ය යොදාගැනීම තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවලට දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් අහිතකර බලපෑම් ඇති වන බව ඇතැමුන්ගේ අදහසයි."
මෙම ප්‍රකාශය හේතුසාධක සහිතව විමසන්න. *(ලකුණු 08 යි)*

40. "ලොව කොතැනක හෝ දිළිඳුභාවය තිබේ ද, එය සෑම තැනකම සෞභාග්‍යය නැති කිරීමට හේතු වේ."
"දිළිඳුභාවය" යන්න ආර්ථික , සමාජයීය, සංස්කෘතික හා පාරිසරික දෘෂ්ටිකෝණ තුළින් විමසන්න.
*(ලකුණු 08 යි)*

* * *

18161

- අංක **21** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති තිත් ඉර මත ලියන්න.

21. මෑතක දී ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය විසින් රුසියාවට විරුද්ධව සම්බාධක පැනවීමට මුල් වූ ප්‍රධාන හේතුව කුමක් ද?

.......................................................................................................

22. සමාජ සාධාරණත්වය හා සමානාත්මතාව සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම ලේඛනය කුමක් ද?

.......................................................................................................

23. ඉන්දියානු සමූහාණ්ඩුව මගින් අලුතින්ම ප්‍රකාශයට පත්කරන ලද ප්‍රාන්ත රාජ්‍යය කුමක් ද?

.......................................................................................................

24. වර්තමානයේ ආසියාවේ අඩුම ජනගහන වර්ධනයක් සහිත රට කුමක් ද?

.......................................................................................................

25. මාලදිවයිනේ රාජ්‍ය භාෂාව කුමක් ද?

.......................................................................................................

26. යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ සම්පූර්ණ නම සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ ලියන්න.

.......................................................................................................

27. "නිල් ග්‍රහලෝකය (blue planet)" නමින් හඳුන්වනු ලබන්නේ කුමන ග්‍රහලෝකය ද?

.......................................................................................................

28. නැනෝමීටරයක් යනු මිලිමීටරයකින් කීයෙන් පංගුවක් ද?

.......................................................................................................

29. මනුෂ්‍ය ශරීරයේ "ඉන්සියුලින්" ශ්‍රාවය කරන ග්‍රන්ථිය කුමක් ද?

.......................................................................................................

30. සූර්යයා මතුපිට උෂ්ණත්වය කෙල්වින් අංශක කොපමණ ද?

.......................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

31. වත්මන් ලෝක ග්‍රාම සංකල්පයට අනුව, සෑම ශ්‍රී ලාංකිකයකුම ශ්‍රී ලාංකිකයකු වශයෙන් ක්‍රියාකිරීමටත් ලෝක පුරවැසියකු වශයෙන් සිතීමටත් පුරුදු පුහුණු විය යුතු වේ.

    (i) සෑම ශ්‍රී ලාංකිකයකුම ලෝක පුරවැසියකු වශයෙන් සිතීමට පුරුදු පුහුණු විය යුත්තේ කුමක් නිසාදැයි දැක්වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

    (අ) .......................................................................................

    (ආ) .......................................................................................

    (ii) වත්මන්හි මායිම් විරහිත ලෝකයක් ඇතිවීමට හේතු දෙකක් දක්වන්න.

    (අ) .......................................................................................

    (ආ) .......................................................................................

[ 5 වැනි පිටුව බලන්න.

13. බ්‍රික්ස් (BRICS) සංවිධානයට අයත් රටවල හයවන සමුළුව සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
    (1) පසුගිය ජූලි මාසයේ බ්‍රසීලයේ දී පැවැත්විණි.
    (2) නව සංවර්ධන බැංකුවක් පිහිටුවීමට සමුළුවේ දී තීරණය කෙරිණි.
    (3) බටහිර මූල්‍ය ආධිපත්‍යයට විකල්ප බැංකුවක් සමුළුවේ දී යෝජනා කෙරිණි.
    (4) සමුළුවේ සභාපති ධුරය සඳහා චීනය තෝරා ගැනිණි. (.........)

14. ඕසෝන් ස්තරයේ විශාලතම සිදුර සෑදී ඇත්තේ මින් කුමන රටක ඉහළ අහසේ ද?
    (1) ඉන්දියාව (2) චීනය
    (3) එක්සත් රාජධානිය (4) ඇන්ටාර්ක්ටිකාව (.........)

15. මින් නොගැළපෙන යෙදුම කුමක් ද?
    (1) සොක්‍රටීස් - දර්ශනය (2) පයිතගරස් - විද්‍යාව
    (3) ප්ලේටෝ - ඉතිහාසය (4) සොෆක්ලීස් - නාට්‍යකලාව (.........)

16. සෑම වර්ෂයකම ලෝක උරුම දිනය (World Heritage Day) පවත්වනු ලබන්නේ කවදා ද?
    (1) අප්‍රේල් 18 (2) අප්‍රේල් 20
    (3) අප්‍රේල් 25 (4) අප්‍රේල් 30 (.........)

17. "මම ඔබ කියන දේ අනුමත නොකරමි. එහෙත් ඔබ කියන දේ ප්‍රකාශ කිරීම සඳහා ඔබට ඇති අයිතියට ඉඩදීමට මම මගේ ජීවිතය පරිත්‍යාග කිරීමට කැමැත්තෙමි. (I disapprove of what you say, but I will defend to the death your right to say it)" යි නමැති සුප්‍රසිද්ධ ප්‍රකාශය කළේ කවු ද?
    (1) වෝල්ටෙයාර් (2) මහත්මා ගාන්ධි
    (3) ලියෝ ටෝල්ස්ටෝයි (4) තෝමස් ජෙපර්සන් (.........)

18. ලෝකයේ ඉදිරිගමනට හේතු වූ ඓතිහාසික සිද්ධීන් හයක් කාල නිවැරදි අනුපිළිවෙළින් සඳහන් වන්නේ පහත කවරක ද?
    (1) පුනර්ජීවන යුගය, කාර්මික විප්ලවය, ප්‍රංශ විප්ලවය, ඇමෙරිකන් විප්ලවය, රුසියන් විප්ලවය, චීන විප්ලවය
    (2) පුනර්ජීවන යුගය, කාර්මික විප්ලවය, ඇමෙරිකන් විප්ලවය, ප්‍රංශ විප්ලවය, චීන විප්ලවය, රුසියන් විප්ලවය
    (3) පුනර්ජීවන යුගය, කාර්මික විප්ලවය, ප්‍රංශ විප්ලවය, රුසියන් විප්ලවය, ඇමෙරිකන් විප්ලවය, චීන විප්ලවය
    (4) පුනර්ජීවන යුගය, ප්‍රංශ විප්ලවය, කාර්මික විප්ලවය, ඇමෙරිකන් විප්ලවය, රුසියන් විප්ලවය, චීන විප්ලවය (.........)

19. "ග්‍රැෆීන් (graphene)" යනුවෙන් හඳුන්වනු ලබන්නේ මින් කවරක් ද?
    (1) විදුලිය හා තාපය සන්නයනය කරනු ලබන චාලක ද්‍රව්‍යයකි.
    (2) ඇමෙරිකානු ජංගම දුරකථන සමාගමකි.
    (3) පැසිපික් සාගරයේ ජීවත්වන බූවල්ලෙකි.
    (4) බටහිර අප්‍රිකාවේ ගල්ගුහාවකින් හමු වූ ප්‍රාග් ඓතිහාසික පොසිලයකි. (.........)

20. 2014 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ දී වැඩිම පදක්කම් සංඛ්‍යාවක් ලබාගත් රටවල් නිවැරදි අනුපිළිවෙළින් සඳහන් වන්නේ පහත කවරක ද?
    (1) එංගලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ස්කොට්ලන්තය, ඉන්දියාව
    (2) එංගලන්තය, ඉන්දියාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ස්කොට්ලන්තය
    (3) එංගලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ස්කොට්ලන්තය, ඉන්දියාව
    (4) එංගලන්තය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, ස්කොට්ලන්තය, කැනඩාව (.........)

*(ලකුණු 01 × 20 = 20 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

## I කොටස

- අංක **1** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. මෑතක දී පැරණි සේද මාර්ගය නැවත ආරම්භ කිරීමට ඉදිරිපත් වී ඇති රට මින් කුමක් ද?
   (1) ඉන්දියාව (2) චීනය (3) ශ්‍රී ලංකාව (4) මියන්මාරය (.........)

2. වත්මන්හි ඇතැම් සමාජ විද්‍යාඥයින් විසින් ඝට්ටනයක් ඇතැයි සලකනු ලබන්නේ මින් කුමන ශිෂ්ටාචාර දෙක අතර ද?
   (1) ඇමෙරිකානු හා චීන (2) ඇමෙරිකානු හා ඉස්ලාමීය
   (3) ඇමෙරිකානු හා ඉන්දියානු (4) ඇමෙරිකානු හා රුසියානු (.........)

3. සාර්ක් කලාපීය රටවල් මුහුණපාන ප්‍රධාන අභියෝගය මින් කුමක් ද?
   (1) දුප්පත්කම (2) සම්පත් හිඟය (3) රැකියා වියුක්තිය (4) අභ්‍යන්තර ආරවුල් (.........)

4. ගෝලීය සමුද්‍ර කොමිසම (The Global Ocean Commission) සඳහන් කරන පරිදි, ලෝකයේ සමුද්‍ර රැකගැනීම අත්‍යවශ්‍ය කාර්යයක් වන්නේ මින් කුමන හේතුවක් නිසා ද?
   (1) මත්ස්‍ය කර්මාන්තය රැකගැනීම
   (2) කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අඩුකිරීම
   (3) මිලියන සංඛ්‍යාත සත්ත්ව වර්ග (species) සොයාගැනීම
   (4) සියලුම ආහාර දාම සමුද්‍ර පරිසරවලින් ආරම්භවීම (.........)

5. ඊශ්‍රායල් රාජ්‍යය පිහිටුවනු ලැබුවේ කුමන වර්ෂයේ ද?
   (1) 1947 (2) 1948 (3) 1949 (4) 1950 (.........)

6. බිම්ස්ටෙක් (BIMSTEC) සංවිධානයට අයත් රටවල් පමණක් ඇතුළත් කාණ්ඩය මින් කුමක් ද?
   (1) ශ්‍රී ලංකාව, නේපාලය, මාලදිවයින, ඉන්දියාව, භූතානය
   (2) ඉන්දියාව, බංග්ලාදේශය, තායිලන්තය, භූතානය, මියන්මාරය
   (3) ශ්‍රී ලංකාව, තායිලන්තය, පකිස්ථානය, නේපාලය, බංග්ලාදේශය
   (4) ඉන්දියාව, මියන්මාරය, බංග්ලාදේශය, තායිලන්තය, ඇෆ්ගනිස්ථානය (.........)

7. ලෝකයේ වැඩියෙන්ම එතනෝල් (ethanol) නිෂ්පාදනය කරනු ලබන රට කුමක් ද?
   (1) බ්‍රසීලය (2) චීනය (3) ඊජිප්තුව (4) ඉන්දියාව (.........)

8. මී පැණි නිෂ්පාදනය වැඩිකිරීම සඳහා වූ කර්මාන්තය හඳුන්වනු ලබන්නේ මින් කුමන නමකින් ද?
   (1) හරිත විප්ලවය (2) ධවල විප්ලවය (3) කහ විප්ලවය (4) රුවන් විප්ලවය (.........)

9. ගෝලීය නවෝත්පාදන දර්ශකයට (Global Innovation Index) අනුව මෙම වර්ෂයේදී සතරවෙනි වරටත් නවෝත්පාදන පිළිබඳව ප්‍රථම ස්ථානය ලබාගත් රට කුමක් ද?
   (1) ස්වීඩනය (2) ස්විට්සර්ලන්තය (3) ජර්මනිය (4) ප්‍රංශය (.........)

10. ගුවන්තානාමෝ (Guantanamo) සිරකඳවුර පිහිටුවා ඇත්තේ කොහේ ද?
   (1) ඇෆ්ගනිස්ථානයේ (2) බාලි දිවයිනේ
   (3) කියුබාවේ (4) ඇමෙරිකා එක්සත් ජනපදයේ (.........)

11. වත්මන්හි යුරෝපා සංගමයට අයත් රටවල් සංඛ්‍යාව කීය ද?
   (1) 27 (2) 28 (3) 29 (4) 30 (.........)

12. කබුකි සහ නෝ නාට්‍ය සම්ප්‍රදාය ආරම්භ වූයේ මින් කුමන රටේ ද?
   (1) චීනය (2) ජපානය (3) ඉන්දුනීසියාව (4) දකුණු කොරියාව (.........)

[ 3 වැනි පිටුව බලන්න.

(iii) ලෝක පුරවැසියකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

32. කිසියම් රටක් හෝ ආයතනයක් හෝ තුළ සිදු කෙරෙන තිරසර සංවර්ධනය මගින්, එම රටෙහි හෝ ආයතනයේ හෝ අනාගත පැවැත්ම තීරණය කරයි.

(i) තිරසර සංවර්ධන සංකල්පය පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය නිර්වචන දෙකක් දක්වන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(ii) තිරසර සංවර්ධනය සඳහා පෙනීසිටින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන දෙකක් දක්වන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(iii) වර්තමාන යුගයට තිරසර සංවර්ධනයෙහි ඇති වැදගත්කම තහවුරු කෙරෙන හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

33. සෑම අයෙකුටම ස්වකීය ජීවිතය සාර්ථක කරගැනීම සඳහා දෘඪ කුසලතා (hard skills) සහ මෘදු කුසලතා (soft skills) අවශ්‍ය වේ.

(i) (අ) "දෘඪ කුසලතා" යනු මොනවා ද?

..........................................................................................

(ආ) "මෘදු කුසලතා" යනු මොනවා ද?

..........................................................................................

(ii) මෘදු කුසලතා දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(iii) ආයතන කාර්ය මණ්ඩල සේවකයන් තුළ මෘදු කුසලතා වර්ධනය කිරීම, වත්මන්හි ලෝක බැංකුවේ වැදගත් ව්‍යාපෘතියකි. මේ ආකාරයට මෘදු කුසලතා වර්ධනය කිරීම වැදගත්වීමට හේතු දෙකක් දක්වන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

34. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රමුඛ අරමුණක් වන්නේ ලෝක සාමය ප්‍රතිෂ්ඨාපනය කිරීම ය.

(i) ලෝක සාමය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් දරනු ලබන ප්‍රයත්න දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(ii) එම ප්‍රයත්න බොහොමයක් මෑත කාලීනව විවේචනයට ලක්වීම කෙරෙහි බල පෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

18136

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2013 (2014)


## (04) කළමනාකරණමය අභියෝග්‍යතාව

පැ තුනයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✻ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**
**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.**

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

.....................................

**වැදගත් :**

✻ මෙම ප්‍රශ්න පත්‍රය I හා II කොටස්වලින් සමන්විත පිටු **11** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✻ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✻ I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම** ද II කොටසේ ප්‍රශ්න **සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද** පිළිතුරු සපයන්න.

✻ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය තුනකි.**

✻ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✻ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✻ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✻ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

✻ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✻ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 3 | |
| 3 | 4 - 7 | |
| 4 | 8 - 10 | |
| 5 | 11 - 15 | |
| 6 | 16 - 20 | |
| 7 | 21 - 28 | |
| 8 | 29 - 35 | |
| 9 | 36 - 40 | |
| 10 | 41 - 45 | |
| 11 | 46 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## I කොටස

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

ජාතික ආහාර සංස්ථාව ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහන මිලට සැපයීමේ ප්‍රධානතම රාජ්‍ය සංස්ථාව වන අතර මෙහි ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන ගබඩා සංකීර්ණය අගනුවර පිහිටා ඇත.

චන්දන වික්‍රමසිංහ මහතා මෙම සංස්ථාවේ සභාපතිවරයා වන අතර සංස්ථාව මගින් බෙදාහරිනු ලබන ආහාර ද්‍රව්‍ය ගබඩා කර බෙදා හැරීම සඳහා දිවයින පුරා සියලුම පළාත් ආවරණය වෙමින් ගබඩා ජාලයක් පවතී. මෙම එක් පළාතක සංස්ථාවේ ගබඩා කිහිපයක් පිහිටා ඇති අතර එබඳු එක් පළාතක පවතින ගබඩා සියල්ලම අධීක්ෂණය සඳහා පළාත් කළමනාකරුවකු බැගින් පත් කර ඇත. සංස්ථාවේ සෑම ගබඩාවක් සඳහා ම තොග නිලධාරියකු බැගින් අනුයුක්ත කර ගබඩාවේ වගකීම එම නිලධාරියාට පවරා ඇත. මෙම ගබඩා අතුරින් ඇතැම් ගබඩාවල ආරක්ෂාව සඳහා සංස්ථාවේ සේවකයින් වන නිත්‍ය ආරක්ෂක නියාමකවරුන් පත් කර ඇති අතර සමහර ගබඩාවල ආරක්ෂාව සැපයීමට පෞද්ගලික ආරක්ෂක සමාගමකට පවරා ඇත. එසේම අවස්ථානුකූලව සංස්ථාවේ ආරක්ෂක කටයුතු සඳහා මෙම පෞද්ගලික ආරක්ෂක සමාගමේ සේවය ලබා ගනී.

2014.06.06 වන දින දහවල් ජාතික ආහාර සංස්ථාවේ නෙළුම්විල ප්‍රදේශය බාර පළාත් කළමනාකරු වන අනුරාධ විජයරත්න මහතා සංස්ථාවේ සභාපති වෙත දුරකථන ඇමතුමක් ලබාදෙමින් තමන් විසින් අධීක්ෂණය කරනු ලබන ගබඩාවක් වන නෙළුම්විල ගබඩාවේ විශාල සහල් තොග ඌනතාවක් පවතින බවට තොරතුරු ලැබී ඇති බව දැනුම් දෙන ලදී. එසේම තමන් විසින් මෙම තොරතුරු පිළිබඳව නෙළුම්විල ගබඩාවේ තොග නිලධාරී සිරිපාල හෙට්ටිගේ මහතාගෙන් කරුණු විමසීමෙන් පසුව එම හිඟ සහල් තොගය අද දින (2014.06.06) රාත්‍රියේ හොර රහසින් ගබඩාවට ප්‍රවාහනය කර හිඟය පියවීමට සැලසුමක් ඇති බවට ද ඒ සඳහා ගබඩාවේ ආරක්ෂක කටයුතු සිදු කරන සංස්ථාවේ ආරක්ෂක නියාමකයින්ගේ සහාය ලැබී ඇති බවට ද තමන් වෙත තොරතුරු ලැබී ඇති බව සභාපති වෙත වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. නෙළුම්විල ගබඩාව පිළිබඳව පළාත් කළමනාකරු විසින් දැනුම් දෙන ලද තොරතුරට අනුව එම ගබඩාව සම්බන්ධයෙන් චන්දන වික්‍රමසිංහ මහතා විසින් ක්ෂණිකව ගතයුතු වඩාත්ම සුදුසු පියවර කුමක් ද?
   (1) වහාම ආසන්නතම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙස පළාත් කළමනාකරුට උපදෙස් දීම
   (2) නෙළුම්විල ගබඩාවේ තොග සත්‍යාපනයක් සිදු කිරීමට කණ්ඩායමක් වහාම පත් කිරීම
   (3) පළාත් කළමනාකරු වහාම අදාළ ගබඩාව වෙත යවා ගබඩාවේ තොග ලේඛනය තමන් භාරයට ගෙන ගබඩාව මුද්‍රා තබන ලෙස උපදෙස් දීම
   (4) සිරිපාල හෙට්ටිගේ මහතා වෙත දුරකථන ඇමතුමක් ලබාදී පළාත් කළමනාකරු විසින් ලබාදෙන ලද තොරතුරු පිළිබඳව ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම (.........)

2. චන්දන වික්‍රමසිංහ මහතාට 2014.06.06 වන දින දහවල් ලද දුරකථන ඇමතුමට අනුව එම මොහොතේ සිට නෙළුම්විල ගබඩාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත හැකි ප්‍රශස්තම පියවර කුමක් ද?
   (1) පළාත් කළමනාකරුට ගබඩාවේ රාත්‍රිය ගත කිරීම සඳහා දැනුම් දෙමින් උපදෙස් නිකුත් කිරීම
   (2) පෞද්ගලික ආරක්ෂක සමාගමට වහාම ක්‍රියාත්මක වන පරිදි ආරක්ෂක කටයුතු පැවරීම
   (3) ගබඩාවේ නිත්‍ය ආරක්ෂක නිලධාරීන්ට සිදුවීම දැනුම් දෙමින් රාජකාරි කටයුතු නිසි අයුරින් සිදුකරන ලෙසට අවවාද කිරීම
   (4) සිරිපාල හෙට්ටිගේ මහතා වහාම ප්‍රධාන කාර්යාලයට කැඳවීම (.........)

3. නෙළුම්විල ගබඩාවේ පවත්නා තොගය කඩිනමින් ගණනය කිරීම සඳහා ගතයුතු ප්‍රශස්තම පියවර කුමක් ද?
   (1) තොගය ගණනය සඳහා ප්‍රධාන කාර්යාලයෙන් විගණන කණ්ඩායමක් වහාම ගබඩාව වෙත යොමු කිරීම
   (2) තොගය වහාම ගණනය කරන ලෙස පළාත් කළමනාකරුට දැනුම් දීම
   (3) තොගය ගණනය කිරීමට පොලිසියේ හෝ ආරක්ෂක අංශවල හෝ සහාය ලබා ගැනීම
   (4) චන්දන වික්‍රමසිංහ මහතා වහාම ගබඩාව වෙත ගොස් පළාත් කළමනාකරුගේ සහයෝගය ඇතිව තොගය ගණනය කිරීම (.........)

[ 3 වැනි පිටුව බලන්න.

4. නෙළුම්විල ගබඩාවේ තොග ඌනතාව ස්ථිරවීමත් සමග සිරිපාල හෙට්ටිගේ මහතා සම්බන්ධයෙන් කඩිනමින් ගතයුතු පියවර කුමක් ද?
   (1) නෙළුම්විල ගබඩාවේ තවදුරටත් සේවය කිරීමට සලස්වා විනය පරීක්ෂණයක් ආරම්භ කිරීම
   (2) රාජකාරි වැඩතහනම් කර විනය පරීක්ෂණයක් ආරම්භ කිරීම
   (3) වාර්තා වූ සහල් තොග ඌනතාව පියවීමට කටයුතු කරන බැවින්, ඔහු සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගැනීම
   (4) සංස්ථාවේ වෙනත් ගබඩාවකට ස්ථාන මාරුවක් ලබාදීම (.........)

5. තොග සත්‍යාපන කටයුතු සඳහා දින ගණනාවක් එක දිගටම නෙළුම්විල ගබඩාව වසා තැබීමට සිදුවුවහොත්, ප්‍රදේශයේ ආහාර හිඟයක් මතුවීමෙන් ප්‍රදේශවාසීන් අතර නොසන්සුන්තාවක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගතයුතු ප්‍රශස්තම පියවර කුමක් ද?
   (1) ජාතික ආහාර සංස්ථාවට අයත් නෙළුම්විල ගබඩාවට ආසන්නතම ගබඩාවෙන් නෙළුම්විල ප්‍රදේශයට ද තොග නිකුත් කිරීමේ මෙහෙයුම් කටයුතු සිදු කරන ලෙස පළාත් කළමනාකරුට උපදෙස් නිකුත් කිරීම
   (2) ප්‍රධාන කාර්යාලයීය ගබඩා සංකීර්ණයෙන් නෙළුම්විල ප්‍රදේශයට අවශ්‍ය ආහාර බෙදාහැරීම
   (3) සංස්ථාවේ ලියාපදිංචි ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ගේ ලොරි රථ මගින් නෙළුම්විල ප්‍රදේශයට ආහාර සැපයීම
   (4) නෙළුම්විල ප්‍රදේශයේ ස්වේච්ඡා සමිති සමාගම්වල නිලධාරීන් ප්‍රධාන කාර්යාලයට කැඳවා උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම හා මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

● අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්ෂවරයා ලෙස සුමන වීරපුර මහතා පත්වීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ පරිපාලනමය හා කාර්යාල ක්‍රම ව්‍යුහයේ ඇති අඩුපාඩු පිළිබඳව සොයා බලන ලදී. එම සොයා බැලීමේදී දෙපාර්තමේන්තුවේ ඒ ඒ රැකියාවන්ට අදාළව රැකියා විස්තර හා රැකියා පිරිවිතර සකස් වී නොමැති බව අනාවරණය විය. ඒ අනුව ඒ ඒ රැකියාවට අදාළ කාර්යයන්, එම රැකියා සඳහා පුද්ගලයකුට තිබිය යුතු අවම සුදුසුකම්, පළපුරුද්ද, වගකීම් හා යුතුකම් ආදිය ඇතුළත් කරමින් රැකියා විස්තර හා රැකියා පිරිවිතර සකස් කිරීමේ වගකීම පරිපාලන නිලධාරි වෙත පැවරීමට තීරණය කරන ලදී. එහි දී අනාවරණය වූයේ පරිපාලන නිලධාරි තනතුර පුරප්පාඩුව පවතින බවයි. එම පුරප්පාඩුව වහාම පිරවීමට තීරණය කළ වීරපුර මහතා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුව පරිපාලන නිලධාරි තනතුරට සුදුස්සෙකු ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් තුළින් තෝරා ගැනීමට තීරණය කරන ලදී.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

6. රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඒ ඒ රැකියාවට අදාළව සකස් කරනු ලබන රැකියා විස්තරයක අඩංගු වියයුතු කරුණක් වන්නේ මින් කුමක් ද?
   (1) රැකියාවට අදාළ කාර්යයන්
   (2) රැකියාවට අදාළ සුදුසුකම්
   (3) රැකියාවට අදාළ වැටුප් පරිමාණය
   (4) රැකියාවට අදාළ කුසලතා (.........)

7. රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඒ ඒ රැකියාවට අදාළව සකස් කරනු ලබන රැකියා පිරිවිතරයක අනිවාර්යයෙන් ම අන්තර්ගත වියයුතු කරුණක් වන්නේ මින් කුමක් ද?
   (1) රැකියාවට අදාළ වගකීම්
   (2) රැකියාවට අදාළ යුතුකම්
   (3) රැකියාවට අදාළව තිබිය යුතු අවම පළපුරුද්ද
   (4) රැකියාවට අදාළව තිබිය යුතු කාර්ය තත්ත්ව (.........)

[ 4 වැනි පිටුව බලන්න.

8. පරිපාලන නිලධාරි තනතුරට පුද්ගලයකු බඳවා ගැනීම සඳහා අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවට වඩාත් වැදගත් වන්නේ මින් කවර හේතුවක් නිසා ද?
   (1) බඳවා ගැනීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුනොවීම
   (2) බඳවා ගනු ලබන තැනැත්තාට දෙපාර්තමේන්තුව පිළිබඳව මනා අවබෝධයක් තිබීම
   (3) දෙපාර්තමේන්තුව තුළ සේවක අභිප්‍රේරණය ඉහළ යාම
   (4) දෙපාර්තමේන්තුව තුළ සේවක උද්සෝෂණ හීනවීම (.........)

9. රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි තනතුරට සුදුස්සෙකු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම තුළින් සිදුවිය හැකි වාසියක් වන්නේ මින් කුමක් ද?
   (1) බඳවා ගැනීමේ කාර්යය සඳහා අමතර පිරිවැයක් සහ කාලයක් වැය නොවීම
   (2) අයදුම්කරුවන්ට අවස්ථානුකූලව ඇතිවන පීඩනය අවම වීම
   (3) අවස්ථානුකූල තත්ත්වයන්ට අයදුම්කරුවන් මුහුණදෙන ආකාරය පරීක්ෂා කළ හැකිවීම
   (4) අයදුම්කරුවන් සාම්ප්‍රදායික ක්‍රමවේදයෙන් බැහැරව පිළිතුරු ලබාදීමට පෙළඹවීම (.........)

10. පරිපාලන නිලධාරි තනතුර සඳහා සුදුස්සෙකු බඳවා ගැනීමට ලිඛිත පරීක්ෂණයක් ද පැවැත්වීමට තීරණය කිරීමෙන් වීරපුර මහතා අපේක්ෂා කරන්නට ඇත්තේ මින් කවර කරුණක් විය හැකි ද?
   (1) අපේක්ෂකයන්ගේ තොරතුරු අවස්ථානුකූලව ලබා ගැනීම
   (2) අපේක්ෂකයන්ගේ පෞරුෂත්ව ලක්ෂණ හඳුනා ගැනීම
   (3) පිරිවැය සහ කාලය අවම කර ගැනීම
   (4) පෞද්ගලික සම්බන්ධතා හෝ බලපෑම් අවම කර ගැනීම (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

රජයේ සියලුම ආයතන සඳහා අවශ්‍ය මෝටර් රථ ආනයනය කරනු ලබන ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස වාහන අධිකාරිය ක්‍රියාකරයි. මෙම අධිකාරියේ ප්‍රධාන මෝටර් රථ අංගනයට කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව විසින් "තාරකා එන්ටප්‍රයිසස්" ආයතනය වෙත පවරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අධීක්ෂණ වගකීම රාජකාරිමය වශයෙන් වාහන අධිකාරියේ අධ්‍යක්ෂ(කාර්මික) අනිල් ප්‍රනාන්දු මහතා වෙත පැවරිණි.

අදාළ ව්‍යාපෘතිය සඳහා තාරකා එන්ටප්‍රයිසස් ආයතනයේ හිමිකරු හා වාහන අධිකාරියේ සභාපති විසින් ගිවිසුමකට එළඹෙන ලද අතර ව්‍යාපෘතිය, ඉදිකිරීම් හා පුහුණු කිරීමේ සංවර්ධන ආයතනයේ (ICTAD) නීතිරීතීන්ට අනුකූලව ක්‍රියාත්මක වියයුතු බව එකී ගිවිසුමේ කොන්දේසි අතර විය.

තවද ගිවිසුමේ වගන්ති ප්‍රකාරව ගිවිසුම අත්සන් කරන ලද දින සිට දින 14 ක් ඇතුළත අංගනයට කාපට් ඇතිරීමේ කටයුතු ආරම්භ කළයුතු අතර සම්පූර්ණ ව්‍යාපෘතිය මාස 03 ක් තුළ නිම කළ යුතු විය.

ගිවිසුම අත්සන් කළ දින සිට දින 02 ක් ඇතුළත ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ වාහන අධිකාරියේ භූමි පරිශ්‍රය වෙත රැගෙන ආ තාරකා එන්ටප්‍රයිසස් ආයතනය, අංගනයේ කාපට් ඇතිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදී. එහෙත් මූලික කටයුතු ආරම්භ කිරීමෙන් සති 02 කට පසුව යන්ත්‍රෝපකරණ එලෙසම තිබියදී තාරකා එන්ටප්‍රයිසස් ආයතනයේ කම්කරුවන් හෝ වැඩ අධීක්ෂකයින් කිසිවෙකුත් ව්‍යාපෘති පරිශ්‍රය වෙත පැමිණ නොසිටි අතර ව්‍යාපෘතියේ වැඩ නතර කර ඇති ස්වභාවයක් දක්නට ලැබුණි.

අකාර්යක්ෂම නිලධාරියකු ලෙස අධිකාරිය තුළ ප්‍රසිද්ධව සිටින අනිල් ප්‍රනාන්දු මහතාට මෙම තත්ත්වය පිළිබඳව අවබෝධයක් නොවූ අතර එමගින් ඉහළ කළමනාකාරිත්වයට ද තත්ත්වය වාර්තා නොවීය. ඉන් සති 02 ක කාලයකට පසු ප්‍රදේශයට මෝසම් වැසි සහිත කාලගුණ තත්ත්වයක් වර්ධනය විය.

මේ අතරතුර අධිකාරියේ රාජකාරි දිනයක් නොවන සෙනසුරාදා දිනයකදී දැනුම්දීමකින් තොරව තාරකා එන්ටප්‍රයිසස් ආයතනය විසින් ව්‍යාපෘති පරිශ්‍රය වෙත රැගෙනවිත් තිබූ යන්ත්‍රෝපකරණ සියල්ල වාහන අධිකාරියේ භූමි පරිශ්‍රය තුළින් පිටතට රැගෙන ගොස් ඇති බව නැවත අධිකාරියේ රාජකාරි කටයුතු ආරම්භ කරන ලද සඳුදා උදෑසන කාලයේදී නිරීක්ෂණය විය. මේ පිළිබඳව වාහන අධිකාරියේ ආරක්ෂක අංශය ද නොදැන සිටීම විමතියට කරුණක් විය.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

[ 5 වැනි පිටුව බලන්න.

11. වාහන අධිකාරියේ මෝටර් රථ අංගනයට කාපට් අතුරා සකස් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ නතරවීම නිසි පරිදි වාර්තා නොවීමට ප්‍රධාන හේතුව මින් කුමක් ද?

(1) වාහන අධිකාරියේ සභාපතිවරයාගේ කළමනාකරණ දුර්වලතාව

(2) වාහන අධිකාරියේ අධ්‍යක්ෂ(කාර්මික)ගේ අධීක්ෂණ දුර්වලතාව

(3) තාරකා එන්ටප්‍රයිසස් ආයතනයේ කළමනාකරණ දුර්වලතාව

(4) වාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ දුර්වලතාව (.........)

12. තාරකා එන්ටප්‍රයිසස් ආයතනය විසින් ගිවිසුම කඩකරමින් ව්‍යාපෘතියේ වැඩ ඉටු නොකිරීමට සූදානමක් පවතින බව අධ්‍යක්ෂ(කාර්මික)ට දැනගන්නට ලැබුණේ නම්, ඔහු විසින් ගතයුතුව තිබූ ප්‍රශස්තම පියවර කුමක් ද?

(1) අදාළ ආයතනයේ හිමිකරු කැඳවා වහාම වැඩ ආරම්භ කරන ලෙසට නියෝග කිරීම

(2) ළඟම ඇති පොලිස් ස්ථානයට ගොස් රාජ්‍ය මුදල් වංචා කිරීම පිළිබඳව අදාළ ආයතනයට එරෙහිව පැමිණිල්ලක් ගොනු කිරීම

(3) වෙනත් ආයතනයක් වෙත අදාළ ව්‍යාපෘතිය පැවරීම

(4) වාහන අධිකාරියේ සභාපති ඇතුළු ඉහළ කළමනාකාරිත්වයට තත්ත්වය වාර්තා කර උපදෙස් පැතීම (.........)

13. තාරකා එන්ටප්‍රයිසස් ආයතනය විසින් ගිවිසුම කඩකරමින් ව්‍යාපෘතියෙන් ඉවත්ව ඇති බව දැනගත් වහාම වාහන අධිකාරියේ ඉහළ කළමනාකාරිත්වය විසින් අදාළ ආයතනය සම්බන්ධයෙන් ගත යුතු පියවර කුමක් ද?

(1) අදාළ ආයතනය විසින් ව්‍යාපෘතිය නතර කිරීම පිළිබඳව ඉදිකිරීම් හා පුහුණු කිරීමේ සංවර්ධන ආයතනය වෙත දැනුම් දී ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කිරීම

(2) ඉදිකිරීම් හා පුහුණු කිරීමේ සංවර්ධන ආයතනය වෙතින් ව්‍යාපෘතිය සඳහා වෙනත් ආයතනයක් නම් කරන ලෙස ඉල්ලා සිටීම

(3) ඉදිකිරීම් හා පුහුණු කිරීමේ සංවර්ධන ආයතනය වෙතින් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයක් ගෙන්වාගෙන වෙනත් සුදුසු ආයතනයක් ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීම

(4) ඉදිකිරීම් හා පුහුණු කිරීමේ සංවර්ධන ආයතනය මගින් ව්‍යාපෘතිය නිම කරවා ගැනීම (.........)

14. ව්‍යාපෘතියට රැගෙනවිත් තිබූ යන්ත්‍රෝපකරණ තාරකා එන්ටප්‍රයිසස් ආයතනය විසින් නොදන්වා රැගෙනයාම සම්බන්ධයෙන් සෘජු වගකීම දැරිය යුතු පාර්ශ්වය කුමක් ද?

(1) වාහන අධිකාරියේ සභාපති

(2) වාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව

(3) වාහන අධිකාරියේ ආරක්ෂක අංශය

(4) වාහන අධිකාරියේ අධ්‍යක්ෂ(කාර්මික) (.........)

15. වාහන අධිකාරියේ මෝටර් රථ අංගනය තුළ කාපට් ඇතිරීම සඳහා ගෙනවිත් තිබූ යන්ත්‍රෝපකරණ භූමි පරිශ්‍රයෙන් ඉවත් කරගෙන යාම සම්බන්ධයෙන් වාහන අධිකාරිය විසින් කඩිනමින් ගතයුතු ප්‍රශස්තම පියවර කුමක් ද?

(1) අදාළ ආයතනයේ හිමිකරු අමතා යන්ත්‍රෝපකරණ වහාම ආපසු රැගෙනවිත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලෙස නියෝග කිරීම

(2) යන්ත්‍රෝපකරණ රැගෙන යාම පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කිරීම

(3) වෙනත් ආයතනයකින් යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාගෙන අධිකාරියේ සේවකභවතුන් ලවා ව්‍යාපෘතිය නිම කිරීම

(4) ආයතනය විසින් රැගෙන ගිය යන්ත්‍රෝපකරණ පොලිසියේ සහයෝගයෙන් අවම බලය යොදා නැවත අධිකාරියේ භූමි පරිශ්‍රය වෙත රැගෙන ඒම (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

● අංක **16** සිට **20** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

ජාතික පෝෂණ සංස්ථාව දිවයින පුරා පාසල් දරුවන් සඳහා පෝෂ්‍යදායී ආහාර බෙදාහැරීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ. සෑම මාස 03 කටම වරක් දිවයින පුරා පිහිටි පාසල් 15 000 කට පමණ මෙම පෝෂ්‍යදායී ආහාර බෙදා හැරීම ලොරි රථ මගින් සිදු කළයුතු වේ. මේ සඳහා පෞද්ගලික ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් 100 දෙනෙකු පමණ සංස්ථාව විසින් ලියාපදිංචි කරගෙන ඇත.

විල්මට් පෙරේරා මහතා මෙම සංස්ථාවේ ප්‍රවාහන කළමනාකරු වේ. සංස්ථාවේ ප්‍රවාහන අංශයේ ප්‍රධානියා වන මොහු නිරන්තරයෙන් "තමන් නිවැරදිය" යන මතයේ සිටිමින් "තමන්ට පමණක් මේ දේ සිදුකළ හැකිය" යන මතවාදී ආකල්පයන්හි එල්ලීගෙන සිටියි. එසේම අසාමාන්‍ය බලඅධිකාරයක් ද තමන් සන්තකයේ රඳවාගෙන සිටින විල්මට් පෙරේරා මහතා ප්‍රවාහන අංශයේ නියෝජ්‍ය කළමනාකරුවන්ට හෝ සහකාර කළමනාකරුවන්ට හෝ බලතල පැවරීමක් ද සිදු කර නැත.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට **නිවැරදි** හෝ **වඩාත්ම ගැළපෙන** හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

16. ජාතික පෝෂණ සංස්ථාවේ පෝෂ්‍යදායී ආහාර බෙදා හැරීම සඳහා ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් 100 දෙනෙකු පමණ ලියාපදිංචි වී සිටීමෙන් සංස්ථාවට සැලසෙන වාසියක් වන්නේ මින් කුමක් ද?
    (1) ලොරි රථ වැඩි ප්‍රමාණයකට ප්‍රවාහන අවස්ථා ලබාදිය හැකිවීම
    (2) වඩාත් කාර්යක්ෂමව පෝෂ්‍යදායී ආහාර බෙදා හැරීමට හැකිවීම
    (3) ප්‍රවාහන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා රැසක් බිහිකිරීමට අවස්ථාවක් ලැබීම
    (4) රාජ්‍ය සංස්ථාවක් තුළ වඩාත් හොඳ ප්‍රවාහන ජාලයක් ස්ථාපිතවීම (.........)

17. එක් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවෙක් පමණක් ජාතික පෝෂණ සංස්ථාවේ ලියාපදිංචි වී සිටියේ නම්, කිසියම් අවස්ථාවකදී සංස්ථාවට මුහුණදීමට සිදුවිය හැකි ගැටලුවක් වන්නේ මින් කුමක් ද?
    (1) ඒකාධිකාරයක් තිබීම තුළින් කිසියම් අවස්ථාවකදී පෝෂ්‍යදායී ආහාර ප්‍රවාහනය අඩාලවීමට වැඩි ඉඩකඩක් තිබීම
    (2) සංස්ථාව අනෙක් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ගේ දෝෂ දර්ශනයට ලක්වීම
    (3) සංස්ථාවේ මුදල් එක් කොන්ත්‍රාත්කරුවකු වෙතට යොමුවීම සම්බන්ධයෙන් නිරන්තර විගණන විමසුම්වලට මුහුණදීමට සිදුවීම
    (4) ප්‍රවාහන කොන්ත්‍රාත්කරුගෙන් සංස්ථාවේ ඉහළ කළමනාකාරිත්වයට බලපෑම් එල්ලවීම (.........)

18. විල්මට් පෙරේරා මහතාගේ කළමනාකාරිත්ව ශෛලිය හැඳින්විය හැකි නම කුමක් ද?
    (1) නිදහස් ශෛලිය
    (2) බලවාදී ශෛලිය
    (3) ස්වාධීන ශෛලිය
    (4) ප්‍රජාතන්ත්‍රවාදී ශෛලිය (.........)

19. විල්මට් පෙරේරා මහතාගේ කළමනාකාරිත්ව ශෛලිය තුළින් ජාතික පෝෂණ සංස්ථාවට ලැබිය හැකි වාසියක් වන්නේ පහත කවරක් ද?
    (1) වෘත්තීය නිපුණත්වයක් ඇති ප්‍රවාහන අංශයේ සේවකයින්ට සංස්ථාවේ අභිවෘද්ධිය වෙනුවෙන් දායකවීමට අවස්ථාවක් ලැබීම
    (2) ප්‍රවාහන අංශය පිළිබඳ තීරණ ගැනීමේ දී බහුවිධ ක්ෂේත්‍රවල සහභාගිත්වයක් ලැබීම
    (3) ප්‍රවාහන අංශයේ යටත් සේවකයන්ගෙන් ඵලදායී දායකත්වයක් නොලැබෙන අවස්ථාවල දී, එම දායකත්වය පහසුවෙන් ලබාගත හැකිවීම
    (4) ප්‍රවාහන අංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවකයන්ගෙන් කැපී පෙනෙන දායකත්වයක් ලබාගත හැකිවීම (.........)

20. විල්මට් පෙරේරා මහතාගේ කළමනාකාරිත්ව ශෛලියේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රවාහන අංශය තුළ දක්නට ලැබිය හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
    (1) ප්‍රවාහන අංශය මගින් ගනු ලබන තීරණ ගුණාත්මක බවින් යුක්තවීම
    (2) ප්‍රවාහන අංශයේ සේවක දක්ෂතා නිසිලෙස එළි දැක්වීමට අවස්ථාවක් ලැබීම
    (3) ප්‍රවාහන කළමනාකරු පිළිබඳව ප්‍රවාහන අංශයේ සේවකයන් තුළ යහපත් ආකල්ප ඇතිවීම
    (4) ප්‍රවාහන අංශය තුළ කැපී පෙනෙන ක්‍රියාකාරීන් නොමැතිවීම (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

- අංක **21** සිට **30** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

සම්පත් සේනානායක මහතා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වන අතර ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් මෙම අධිකාරියේ පාලන කටයුතු සිදු කෙරේ.

ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය ඉලක්ක කර ගනිමින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ දැක්ම, මෙහෙවර, අරමුණු හා පරමාර්ථ නිශ්චය කර ඇත. එමෙන්ම අරමුණු හා පරමාර්ථ තවදුරටත් නිශ්චය කිරීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ ඉහළ, මධ්‍යම හා පහළ යන කළමනාකරණ මට්ටම් සඳහා නිලධාරීන් රැසක් අනුයුක්තව සිටිති. සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මෙන්ම සාමාන්‍යාධිකාරී, අංශභාර කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන්, වැඩ සුපරීක්ෂකවරුන් ආදී නිලධාරීන් ද ඒ අතර වේ.

රජය මගින් ග්‍රාමීය පාලම් හා බෝක්කු අළුත්වැඩියා කිරීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ වගකීම ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියට පවරන ලදී. ඒ අනුව ඉදිරි පස් වසර තුළ ග්‍රාමීය පාලම් හා බෝක්කු සියල්ල අළුත්වැඩියා කර අවසන් කිරීමේ සැලැස්මක් සකස් කරන ලදී. මෙම සැලැස්ම වඩාත් ප්‍රායෝගිකව හා නිශ්චිත ඉලක්කගත කාල සීමාවන් තුළදී නිම කිරීම සඳහා අධිකාරියේ සියලුම කළමනාකරණ මට්ටම්වලට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කිරීමේ විශේෂ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙහිදී එම නිලධාරීන්ගේ සංකල්පනාත්මක, අන්තර් පුද්ගල, විනිශ්චයාත්මක, විශ්ලේෂණාත්මක හා තාක්ෂණික යන කුසලතා වර්ධනය සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ ඒ කළමනාකරණ මට්ටම් සඳහා වඩා වැදගත් හා වැඩි වශයෙන් අවශ්‍ය වන කුසලතා හඳුනා ගනිමින් එම නිලධාරීන්ට අත්‍යවශ්‍ය කුසලතා වර්ධනයට ද වැඩි අවධානයක් යොමු කරන ලදී.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර,** දී ඇති **තිත් ඉර මත** ලියන්න.

21. යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මට්ටම් වර්ගීකරණයේදී සම්පත් සේනානායක මහතා කුමන කළමනාකරණ මට්ටමකට අයත් වේ ද?

.......................................................................................................................

22. යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ වැඩ සුපරීක්ෂකවරු අයත් වනුයේ කුමන කළමනාකරණ මට්ටමකට ද?

.......................................................................................................................

23. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ක්‍රියාවට නංවනුයේ කුමන මට්ටමකට අයත් කළමනාකරුවන් විසින් ද?

.......................................................................................................................

24. යටිතල පහසුකම් සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව සිදු වන නව තාක්ෂණික වෙනස්කම්, සොයාගැනීම් ආදිය පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටිය යුත්තේ කුමන මට්ටමකට අයත් කළමනාකරුවන් ද?

.......................................................................................................................

25. සම්පත් සේනානායක මහතා සතුව වැඩි වශයෙන් තිබිය යුත්තේ කුමන කුසලතා ද?

.......................................................................................................................

26. විශ්ලේෂණාත්මක කුසලතා වැඩි වශයෙන් තිබිය යුත්තේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ කුමන මට්ටමේ කළමනාකරුවන්ට ද?

.......................................................................................................................

27. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ වැඩ සුපරීක්ෂකවරුන් සතුව වැඩි වශයෙන් තිබිය යුත්තේ කුමන කුසලතා ද?

.......................................................................................................................

28. ඉදිරි පස් වසර තුළ ග්‍රාමීය පාලම් හා බෝක්කු සියල්ල අළුත්වැඩියා කර අවසන් කිරීම සඳහා වූ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ සැලැස්ම සකස් කිරීමේ වගකීම දැරීමට සිදුවනුයේ කුමන මට්ටමේ කළමනාකරුවන්ට ද?

.......................................................................................................................

[ 8 වැනි පිටුව බලන්න.

29. යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ ඉදිරි පස්වසර සඳහා වන සැලැස්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී වැඩි වගකීමක් දැරීමට සිදුවනුයේ කුමන මට්ටමේ කළමනාකරුවන්ට ද?

.............................................................................................................................

30. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියේ වැඩ සුපරීක්ෂකවරු වැඩි වශයෙන් සම්බන්ධතා පවත්වා ගත යුත්තේ කුමන මට්ටමේ කළමනාකරුවන් සමග ද?

.............................................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

බලශක්ති අර්බුදය හමුවේ විකල්ප බලශක්ති ජනතාවට හඳුන්වාදීම හා විකල්ප බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් විකල්ප බලශක්ති අධිකාරිය පිහිටුවන ලදී. බලශක්ති සංරක්ෂණය තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම, අධිකාරියේ ලාභදායක තත්ත්වය වර්ධනය කිරීම හා ප්‍රාග්ධන කොටස්වල දිගු කාලීන අගය වැඩි කිරීම, විකල්ප බලශක්ති ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ආදිය විකල්ප බලශක්ති අධිකාරියේ අරමුණු වන අතර අධිකාරියේ විකල්ප බලශක්ති නිෂ්පාදනය ඉදිරි වසර තුළ දී 10% කින් ද ඉදිරි දස වසර තුළ දී 50% කින් ද වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම අධිකාරියේ පසුගිය වාර්ෂික වාර්තාවට අනුව අධිකාරිය මගින් ස්ථාපනය කරන ලද විකල්ප බලශක්ති බලාගාරවල නිෂ්පාදන පිරිවැය අඩුවී ලාභදායකත්වය වැඩි වී ඇත. එසේම එම බලාගාරවල යෙදවුම්වලට වඩා නිමැවුම් ද වැඩිවී ඇත. ඉහත ප්‍රතිඵල හා තොරතුරු තුළින් විකල්ප බලශක්ති අධිකාරිය කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු ළඟා කර ගත්තේද යන්න නිශ්චය කර ගත හැකි ය.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර,** දී ඇති **තිත් ඉර මත කෙටියෙන්** ලියන්න.

31. විකල්ප බලශක්ති අධිකාරියේ කාර්යක්ෂමතාව (Efficiency) පිළිබිඹු කරන නිර්ණායක දෙකක් දක්වන්න.

(i) .............................................................................................................

(ii) .............................................................................................................

32. විකල්ප බලශක්ති අධිකාරියේ දිගුකාලීන අරමුණු (Aims) දෙකක් සඳහන් කරන්න.

(i) .............................................................................................................

(ii) .............................................................................................................

33. විකල්ප බලශක්ති අධිකාරියේ ඵලදායිතාවේ (Productivity) වැඩිවීමක් සිදුවී ඇති බව සනාථ කළ හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

(i) .............................................................................................................

(ii) .............................................................................................................

34. විකල්ප බලශක්ති අධිකාරියේ සමාජයීය අරමුණු දෙකක් සඳහන් කරන්න.

(i) .............................................................................................................

(ii) .............................................................................................................

35. විකල්ප බලශක්ති අධිකාරියේ පරමාර්ථ (Goals) දෙකක් දක්වන්න.

(i) .............................................................................................................

(ii) .............................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

[ 9 වැනි පිටුව බලන්න.

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

සුළංයාය ව්‍යවසායකත්ව මණ්ඩලය, සුළංයාය ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාරික කටයුතු දියුණු කර ගැනීම සඳහා ව්‍යවසායකත්ව පුහුණු හා තාක්ෂණික උපදෙස් ලබා දෙන ආයතනයයි.

මෙම මණ්ඩලයට අනුයුක්තව ක්ෂේත්‍ර නිලධාරීන් 75 දෙනෙකු පමණ සේවය කරන අතර මණ්ඩලයේ ප්‍රධානියා ලෙස විධායක අධ්‍යක්ෂ හේමන්ත සිරිවර්ධන මහතා කටයුතු කරයි.

හේමන්ත සිරිවර්ධන මහතා සිය නිලධාරී මඩුල්ල නිසි ලෙස මෙහෙයවීමට, පාලනයට හා ප්‍රගති සමාලෝචනයට විවිධ වූ උපක්‍රම භාවිත කරයි. කාර්ය මණ්ඩල රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, රැස්වීම් වාර්තා සකස් කිරීම්, අභ්‍යන්තර කාර්යාල නියෝග නිකුත් කිරීම් හා ව්‍යවසායකත්ව කමිටු රැස්වීම් පැවැත්වීම ඉන් කිහිපයකි. මෙම රැස්වීම් අතුරින් ප්‍රගති සමාලෝචන රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර ඒ සඳහා කැඳවීම් ජංගම දුරකථන කෙටිපණිවුඩ මගින් සිදු කෙරේ. ඒ අනුව කරන ලද දැනුම්දීම් මත පසුගිය ජූනි මස පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමට ක්ෂේත්‍ර නිලධාරීන් 75 දෙනාම සහභාගි විය.

2014.07.07 වන දින සුළංයාය ව්‍යවසායකත්ව මණ්ඩලයේ සැලසුම් අංශය මගින් ප්‍රදේශයේ කාන්තා ව්‍යවසායකයින් 100 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පුහුණු වැඩමුළුවක් මණ්ඩලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙම වැඩමුළුවට කාන්තා ව්‍යවසායකයින් 100 දෙනෙකු කැඳවීම ලිපි මගින් සිදු කර ඇත.

හේමන්ත සිරිවර්ධන මහතාට බෙහෙවින් සමීප යැයි කාර්ය මණ්ඩලය තුළ රාවයක් පවතින මණ්ඩලයේ ලිපිකාරිනියක් වන ඉනෝකා බලවංශ මහත්මිය මෙම වැඩමුළුවේ දිවා විවේක කාලයෙන් පසුව සිරිවර්ධන මහතාගේ නිල කාමරයට පැමිණ වැඩමුළුවට සහභාගීවී සිටින කාන්තාවන් කිහිපදෙනෙකු හා කාර්යාලයේ ලිපිකාරිනියන් තිදෙනෙකු අතර බහින්බස්වීමක් සිදුවූ බව රහසින් ප්‍රකාශ කර කාමරයෙන් පිටතට යන ලදී. ඉනෝකා බලවංශ මහත්මිය මෙම සිද්ධිය පිළිබඳව දැනුවත් වී ඇත්තේද වැඩමුළුවට සහභාගිවී සිටි කාන්තාවක් විසින් කරන ලද දැනුම්දීමකට අනුව ය.

වැඩමුළුව අවසන් වූ පසුව හේමන්ත සිරිවර්ධන මහතා වෙත පැමිණි වැඩමුළුවට සහභාගි වූ කාන්තාවන් කිහිපදෙනෙකු විසින් සිරිවර්ධන මහතා වෙත කරුණු දක්වමින් ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. එම පැමිණිල්ලේ සඳහන් වූයේ දිවා ආහාරය ලබා ගැනීමට ගියවිට මණ්ඩලයේ ලිපිකාරිනියන් තිදෙනෙකු තම පිරිස දෙස රවා බලමින් අවඥාවෙන් සිනාසුණු බවත්, ඉන් තම ආත්ම ගරුත්වයට හානි සිදුවූ බවත්, එබැවින් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටින බවත් ය.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති **තිත් ඉර මත කෙටියෙන්** ලියන්න.

36. සුළංයාය ව්‍යවසායකත්ව මණ්ඩලයේ විධිමත් ලිඛිත සන්නිවේදන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(i) ........................................................................................................

(ii) ........................................................................................................

37. අවාචික සන්නිවේදනයට නිදසුන් දෙකක් දක්වන්න.

(i) ........................................................................................................

(ii) ........................................................................................................

38. අවිධිමත් සන්නිවේදනය සිදුවූ අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(i) ........................................................................................................

(ii) ........................................................................................................

39. සුළංයාය ව්‍යවසායකත්ව මණ්ඩලයේ සන්නිවේදන කාර්යය හොඳින් සිදුවන බවට නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න.

(i) ........................................................................................................

(ii) ........................................................................................................

40. සුළංයාය ව්‍යවසායකත්ව මණ්ඩලයේ සමූහ සන්නිවේදනය සිදු වූ අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(i) ........................................................................................................

(ii) ........................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

[ 10 වැනි පිටුව බලන්න.

● අංක **41** සිට **45** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

පාඩු ලබන රාජ්‍ය සංස්ථාවක් වශයෙන් සැලකෙන රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණය කරමින් රජයට බරක් නොවන ආයතනයක් බවට පත් කිරීම සඳහා නව කළමනාකාරිත්ව කමිටුවක් පත් කරන ලදී.

මෙම කමිටුව මගින් සංස්ථාවේ දුර්වලතා හා ශක්තීන් හඳුනා ගනිමින් ආයතනයේ සංවර්ධනයට පවත්නා බාධක හඳුනාගැනීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී යන්ත්‍රෝපකරණ ක්ෂේත්‍රයේ පෞද්ගලික ආයතන අත්පත් කරගෙන ඇති නව තාක්ෂණ ප්‍රවණතා නිසා රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාවේ නිමැවුම් හා යන්ත්‍රෝපකරණ පිළිබඳව පාරිභෝගිකයන් තුළ යහපත් ආකල්පයක් නොමැති බව පැහැදිලි විය. මෙම තත්ත්වය මනා ලෙස වටහා ගනිමින් සංස්ථාවේ පූර්ව අත්දැකීම්, බාහිර පරිසරය ආදිය මනා ලෙස ග්‍රහණය කරගනිමින් සංස්ථාව වෙනුවෙන් උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට කළමනාකාරිත්ව කමිටුව තීරණය කරන ලදී. එහිදී සංස්ථාවේ අනාගතය මත පදනම්ව, සංස්ථාව සතු සම්පත්වල ඵලදායිතාව වර්ධනය කර ගැනීමට ද අවධානය යොමු කරන ලදී.

මෙම සිද්ධිය/අවස්ථාව ඇසුරින් පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත් ඉර මත කෙටියෙන්** ලියන්න.

41. රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාව හමුවේ ඇති අභියෝග ජය ගැනීම සඳහා එහි අභ්‍යන්තර පරිසරය විමර්ශනය කළ යුතු වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(i) ................................................................................

(ii) ................................................................................

42. රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාවට බාහිර පරිසරයෙන් එල්ල වන බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(i) ................................................................................

(ii) ................................................................................

43. රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාවට උපාය මාර්ගික සැලැස්මක් වැදගත්වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(i) ................................................................................

(ii) ................................................................................

44. රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාව මගින් උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමේදී අවධානයට ලක්කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(i) ................................................................................

(ii) ................................................................................

45. රාජ්‍ය යන්ත්‍රෝපකරණ සංස්ථාව මගින් සකස් කරනු ලබන උපාය මාර්ගික සැලැස්මක අන්තර්ගත විය යුතු වැදගත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(i) ................................................................................

(ii) ................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

## II කොටස

● පහත සඳහන් සිද්ධිය/අවස්ථාව කියවා අංක **46** සිට **50** තෙක් ප්‍රශ්නවලට සපයනු ලබන කඩදාසිවල **පිළිතුරු** ලියන්න.

සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස කටයුතු කළ විපුල කරුණාසිරි මහතා 2014.01.31 වන දින විශ්‍රාම යන ලදී. වසර 10 කට අධික කාලයක් සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම්වරයා වශයෙන් කටයුතු කළ විපුල කරුණාසිරි මහතාගේ සේවය පිළිබඳව සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාව හා කාර්ය මණ්ඩලයේ බහුතර නිලධාරීන් අතර පැවතියේ අප්‍රසාදයකි.

තම රාජකාරියට වඩා පෞද්ගලික අභිමතාර්ථ ඉටුකර ගැනීමෙහිලා ප්‍රමුඛත්වය ලබාදුන් නිලධාරියකු ලෙස ද කාර්ය මණ්ඩලයේ තෝරාගත් නිලධාරීන් පිරිසකට පමණක් පක්ෂපාති ලෙස කටයුතු කළ හා කාර්ය මණ්ඩලයට නිසි නායකත්වයක් සැපයීමට අපොහොසත් වූ නිලධාරියකු ලෙස ද විපුල කරුණාසිරි මහතා ප්‍රසිද්ධව සිටියේය.

[ 11 වැනි පිටුව බලන්න.

විපුල කරුණාසිරි මහතා විශ්‍රාම යාමත් සමගම මධුර සමරසේකර මහතා සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් තනතුරට පත්විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස කටයුතු කර ඇති මධුර සමරසේකර මහතා එම කාර්යාල ජනතා සේවය තුළින් විශිෂ්ටතම කාර්යාල බවට පත් කිරීමට දායකවූ කීර්තිමත් රාජ්‍ය නිලධාරියෙකි.

විශේෂයෙන්ම ඵලදායිතාව, කාර්යක්ෂමතාව, කණ්ඩායම් වැඩ, කාල කළමනාකරණය, පංචවිධ සංකල්පය ආදී සංකල්ප ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමෙහිලා මනා හැකියාවක් ඇති නිලධාරියකු වශයෙන් ද මධුර සමරසේකර මහතා ක්ෂේත්‍රයේ ජනප්‍රියව ඇත.

සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජකාරි කටයුතු බාරගත් මධුර සමරසේකර මහතාට කාර්යාලයේ භෞතික පරිසරය ඉතා අක්‍රමවත් බවත් සේවා ලබාගැනීමට පැමිණෙන ජනතාවට අවම මූලික පහසුකම් පවා නොමැති බවත් නිරීක්ෂණය විය.

කාර්යාලයේ අංශ හා යටත් නිලධාරීන් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොවීමත්, නිලධාරීන් අතර බලතල නිසි ලෙස බෙදා නොතිබීමත්, දෛනික තැපැල, ලිපිගොනුකරණය ආදි කටයුතු සඳහා විධිමත් කාර්යාල ක්‍රම අනුගමනය නොකිරීමත් නිසා කාර්යාලයීය කටයුතු හා සේවා මන්දගාමී ලෙස සිදුවන බව මධුර සමරසේකර මහතාට අනාවරණය කර ගත හැකි විය. එසේම සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විවිධ තනතුරුවල පුරප්පාඩු රැසක් පැවතියත් එම පුරප්පාඩු පිරවීම සඳහා අවම උත්සාහයක්වත් දරා නොමැති බව ද පැහැදිලි විය. එසේම ප්‍රදේශයේ අනෙකුත් රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන හා නිලධාරීන් සමග විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරයා කිසිදු සම්බන්ධතාවක් හෝ සුහදතාවක් නොපැවැත්වීම නිසාම ඇතැම් ගැටලු පැනනැගී ඇති බව ද වාර්තා විය.

සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෙම අහිතකර තත්ත්වය කඩිනමින් වෙනස් කිරීමට මධුර සමරසේකර මහතා විසින් තමන් ප්‍රගුණ කර ඇති සංකල්ප ප්‍රයෝජනයට ගනිමින් ජනතාවට හා කාර්ය මණ්ඩලයට හිතකර කාර්යාල පිරිසැකැස්මක් සකස් කිරීමටත්, කාර්ය මණ්ඩලයේ ධනාත්මක ආකල්ප වර්ධනයට පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් කටයුතු යොදන ලදී. මීට අමතරව විමධ්‍යගත හා පළාත් සභා ප්‍රතිපාදන මෙන්ම දිස්ත්‍රික් ලේකම්වරයා හරහා ප්‍රතිපාදන ලබාගනිමින් කාර්යාලයේ භෞතික පරිසරය සංවර්ධනය කිරීමට ද පියවර ගන්නා ලදී. එසේම නිසි සංවිධානාත්මක බවකින් හා සැලසුම්වලින් තොරව පැවැති කාර්යාලයේ කටයුතු වඩාත් සංවිධානාත්මක හා නිසි සැලසුම් සහිතව ක්‍රියාත්මක කිරීමට අංශ මට්ටමින් විශේෂ වැඩ සටහනක් ද ක්‍රියාවට නංවන ලදී.

මෙම ක්‍රියාදාමය තුළ කෙටි කාලයක් තුළදී සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වේගවත් කාර්යක්ෂමතාවක් ඇති වූ අතර ප්‍රසන්න කාර්යාල පරිසරයක් ද බිහිවිය. එසේම කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගෙන් බහුතරයක් ඇඩි උද්යෝගයෙන් හා කැපවීමෙන් කටයුතු කිරීමට ද උනන්දු වූහ.

සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෙම වෙනස්කම් සිදු කිරීමේදී ඊට අනුගත නොවූ, අකාර්යක්ෂම නිලධාරීන් කිහිපදෙනෙකුගේ සේවා අංශ මාරු කිරීමට ද මධුර සමරසේකර මහතා කටයුතු කරන ලදී. එසේ අංශ මාරු කරන ලද නිලධාරීන් කිහිපදෙනා අතර සද්ධාමංගල වීරසේකර මහතා ද විය. සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය සහකාර ලෙස කටයුතු කරන ලද සද්ධාමංගල වීරසේකර මහතා විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම් විපුල කරුණාසිරි මහතාට පක්ෂපාති නිලධාරියෙකි. ඔහු මධුර සමරසේකර මහතා විසින් සිදු කරනු ලබන සියලු කාර්යයන් විවේචනය කරමින්, කාර්යක්ෂමව සේවය කරන නිලධාරීන්ට බලපෑම් හා තර්ජන සිදු කරමින් කටයුතු කරන්නට විය. ඉන් නොනැවතුණු ඔහු මධුර සමරසේකර මහතාට එරෙහිව නිර්නාමික පෙත්සමක් රාජ්‍ය සේවා විමර්ශන ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදී. ඒ අනුව රාජ්‍ය සේවා විමර්ශන ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් මධුර සමරසේකර මහතාගේ කටයුතු පිළිබඳව විමර්ශනයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

46. විපුල කරුණාසිරි මහතාගේ පරිපාලනය තුළ සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දක්නට ලැබුණු පොදු පරිපාලන ගැටලු මොනවා ද? *(ලකුණු 08 යි)*

47. සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම් විපුල කරුණාසිරි මහතා තුළ දක්නට ලැබුණු කළමනාකරණ දුර්වලතා කවරේ ද? *(ලකුණු 08 යි)*

48. සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මධුර සමරසේකර මහතා යොදා ගත් උපක්‍රම කවරේ ද? *(ලකුණු 08 යි)*

49. සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්යාලයීය පරිසරය වෙනස් කිරීම සඳහා මධුර සමරසේකර මහතා ගත් පියවර මොනවා ද? *(ලකුණු 08 යි)*

50. මධුර සමරසේකර මහතා සඳගලතැන්න ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස පත්වීමෙන් අනතුරුව සිදුකර ඇති කාර්යභාරය අගය කරමින්, ඔහුගේ නිර්දෝෂීබව දක්වමින් රාජ්‍ය සේවා විමර්ශන ආයතනයේ අධ්‍යක්ෂවරයාට වාර්තාවක් යොමු කිරීමට දිස්ත්‍රික් ලේකම්වරයා තීරණය කරන ලදී. එම වාර්තාව කෙටුම්පත් කරන්න. *(ලකුණු 08 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

| ප්‍ර. අංකය | ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 (i) | |
| 4 (ii) | |
| 4 (iii) | |
| එකතුව | |
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)

## (05) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා

පැ තුනයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

**විභාග අංකය :** ......................

1. පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන විශ්ලේෂණාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් වචන සංඛ්‍යාව **250 – 300** අතර වන සේ රචනාවක් ලියන්න.

   (i) මනුෂ්‍ය ප්‍රජාවට තර්ජනයක් වූ මත්ද්‍රව්‍ය ජාවාරම ලෝකයෙන් තුරන් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

   (ii) ලෝකයේ කාන්තා හිංසනය පිටු දැකීමත් පුරුෂාධිපත්‍යය නිසා අහිමි වී ගිය සිය අයිතිවාසිකම් දිනා ගැනීමත් සඳහා ක්‍රියාත්මක වන ස්ත්‍රීත්වවාදී ව්‍යාපාර

   (iii) පෞරුෂ වර්ධනය, චිත්ත විවේකය හා මානුෂික ගුණදහම් වගාව උදෙසා සාහිත්‍යය හා ලලිතකලා අධ්‍යයනයෙන් සැලසෙන යහපත

   (iv) කර්මාන්ත සංවර්ධනය සඳහා නැනෝ තාක්ෂණය යොදා ගැනීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ

   (v) මාර්ග ජාලය හා ප්‍රවාහන සේවා සංවර්ධනය මගින් ශ්‍රී ලාංකිකයන්ට හිමි වන වරප්‍රසාද

   (vi) මැදපෙරදිග කලාපයේ දේශපාලන අර්බුද හා ගැටුම් විසඳීම උදෙසා ලෝක බලවතුන්ගේ මැදිහත්වීම

[ 2 වන පිටුව බලන්න.

[ 3 වන පිටුව බලන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 30 යි)

**2.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. සාරාංශය අවසානයේ ඔබ ලියූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ සුබසාධනය වැඩිදියුණු කරමින් 2010 දී විදේශ රැකියා අවස්ථා වැඩිපුර ආකර්ෂණය කර ගැනීම සඳහා අදාළ අධිකාරීන් විසින් ප්‍රතිපත්තිමය නිර්දේශ රැසක් හඳුන්වා දෙනු ලැබිණි. ඒ අනුව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ උපදේශකත්වය සහිතව කම්කරු සංක්‍රමණිකයන්ට අදාළ ප්‍රධාන ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික කම්කරු සංක්‍රමණ ප්‍රතිපත්තියක් සැකසිණි. සංක්‍රමණික සේවකයන් සඳහා යහපාලනයක් ඇති කිරීම හා අදාළ රෙගුලාසි සැකසීම, ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයන් සඳහා ඵලදායී ආරක්ෂණයක් හා සේවාවක් සැපයීම සහ නැවත පැමිණෙන්නන් යළි ඒකාබද්ධ කිරීම හා වැඩි ප්‍රේෂණ ප්‍රමාණයක් එක්රැස් කිරීම, මෙම ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ඉලක්ක විය. තව ද ද්විපාර්ශ්වික ගිවිසුම්, අවබෝධතා ගිවිසුම්, සත්කාරක රටවල සිටින සංක්‍රමණික සේවකයන්ට අදාළ ප්‍රතිපත්ති පිළියෙල කිරීම සඳහා එම රටවලට බලපෑම් කිරීම සහ විදේශ රටවල පිහිටි ශ්‍රී ලාංකික දූත සේවාවන් මගින් සංක්‍රමණික ශ්‍රමික සබඳතා වඩාත් හොඳින් සම්බන්ධීකරණය කිරීම හරහා සංක්‍රමණික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සබඳතා පහසු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂය සීමාව යටතට ගැනිණි.

කාන්තා සංක්‍රමණික සේවකයන් සඳහා පැවැත්වුණු අනිවාර්ය පුහුණු වැඩසටහන්වලට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පිරිමි සේවකයන් සඳහා ද දින පහක අනිවාර්ය හැකියා වර්ධන වැඩටහනක් ආරම්භ කරන ලදි. ප්‍රධාන කාර්යාලය සහ එහි දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය කාර්යාල, සහ ශ්‍රමිකයන් ලබා ගන්නා රටවල පිහිටි ශ්‍රී ලාංකික දූත සේවාවන් හා දේශීය සේවකයන් බඳවා ගැනීමේ නියෝජිතයන් සමඟ සබඳතා පවත්වා ගැනීම සඳහා වඩාත් වැදගත් වන පරිගණක ජාල පද්ධතියක් ද සකසනු ලැබිණි. තව ද විදේශ රැකියා සඳහා සංක්‍රමණික ශ්‍රමිකයන් යෙදවීම සම්බන්ධයෙන් බඳවා ගැනීමේ නියෝජිත ආයතන මගින් සපයනු ලබන අගනා සේවය සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතනවල කාර්ය සාධනය ඇගයීමට සහ ඔවුනට ජාතික මට්ටමේ පිළිගැනීමක් ලබාදීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ තාක්ෂණික සහයෝගය ඇතිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රේණිගත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලදි.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

[ 4 වන පිටුව බලන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

*(ලකුණු 25 යි)*

**3.** පහත දැක්වෙන එක් එක් පාඨයෙහි ප්‍රධාන අදහස හැකිතාක් කෙටියෙන් **එක් වාක්‍යයකින්** දක්වා, **තද කළු අකුරින්** මුද්‍රිත යෙදුම්වලට **විවරණ** සපයන්න.

(i) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග සම්පාදනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. 2010 වර්ෂය තුළදී ලෝක බැංකුව මගින් "අර්බුදයන්ට මුහුණදීම සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය" යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කෙරිණි. මෙම යෝජනා ක්‍රමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන්ට මූල්‍ය පහසුකම් ලබාදීමේදී, **ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම**, අර්ධ ණය සහතික කිරීම මෙන්ම අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම යනාදිය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පහසුකම් සපයන ලදි. ගෝලීය ආර්ථික අර්බුදය මගින් දැඩි බලපෑමකට ලක් වූ උපකොන්ත්‍රාත් පදනම යටතේ ක්‍රියාත්මක වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කිරීමට මෙන්ම ඔවුනට සියයට 10 ක සහනදායී ආදායම් බදු අනුපාතයක් ලබාදීමට ද 2011 අයවැය මගින් යෝජනා කර ඇත.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(ii) දේශපාලන හා ආර්ථික අංශවල ඇතිවන වෙනස්වීම් සමාජ ක්‍රමය කෙරෙහි බලපායි. එම බලපෑම බාල පරපුරේ අධ්‍යාපනය සඳහා ඇති කරනු ලබන අධ්‍යාපන ආයතනවලින් මනාව පිළිබිඹු වේ. ඉකුත් සියවස මැද භාගයේදී බ්‍රිතාන්‍යයන් තම දේශපාලන බලය මෙහි තහවුරු කළේ වඩා කාර්යක්ෂම පාලන ක්‍රමයක් මගිනි. එහි ලා උපයෝගී කර ගන්නා ලද බලගතු ආයුධය අධ්‍යාපනයයි. බටහිරින් ආභාසය ලත් අධ්‍යාපන ක්‍රමය නිසා චිරන්තන ගුරු-ගෝල පිළිවෙත වෙනුවට පාසල් ගුරුවරයෙකු යටතේ විශාල ශිෂ්‍ය පිරිසකට පන්ති කාමරයක ඉගැන්වීමේ පිළිවෙත බිහි වූයේය. මෙම පිළිවෙත එංගලන්තයේ පැවති අධ්‍යාපන ක්‍රමය අනුව සකස් කරන ලද්දේ ය. මෙහි විෂය මාලාව වුවද ජනතාවගෙන් විශාල කොටසකගේ අවශ්‍යතා හා මනා ලෙස සම්බන්ධ නොවීය.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(iii) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය පිහිටුවීමෙන් පසු ගෘහ කර්මාන්ත වශයෙන් පාරම්පරික කලා ශිල්ප පුහුණු වී අතිරේක ආදායම් මාර්ගයක් සලසා ගැනීමට රුකුලක් දීම කෙරෙහි වැඩි සැලකිල්ලක් ඇති විය. "ස්වරාජ් ව්‍යාපාරය" යැයි එවකට නම් ලද, නිදහස අරබයා ඉන්දියාව කළ සටන මෙහි දේශපාලන චින්තනය කෙරෙහි ද තදින් බලපෑවේය. ඉන්දීයයෝ මෙම පරිශ්‍රමයේදී බලගතු අවියක් ලෙස ආයාත ආදේශනය නමින් යුතු ආර්ථික උපක්‍රමය යොදමින් ආයාත භාණ්ඩ වෙනුවට දේශීය නිෂ්පාදන පරිභෝජනයට ගන්නා ලෙස මහජනයාගෙන් ඉල්ලමින් "ස්වදේශී ව්‍යාපාරය" ගෙන ගියහ. මෙයින් අප රටේ ජාතිමාමකයන්ට ද **ආයාත ආදේශන ක්‍රමය** මගින් සිය රටට ද ආර්ථික විමුක්තියක් ලබාගත හැකි බව පෙනී ගියේය.

[ 5 වන පිටුව බලන්න.

එහෙත් මෙහි ලා බලවත් පරිශ්‍රමය යොමුවූයේ විශාල යන්ත්‍ර සූත්‍ර සහ අධික වියදම් අවශ්‍ය නොවන, බෙහෙවින් ගෘහ කර්මාන්ත ගණයේ ලා සැලකුණු පාරම්පරික කලාශිල්ප දියුණු කිරීම උදෙසා ය.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

*(ලකුණු 05 × 3 = 15 යි)*

**4.** පහත දැක්වෙන එක් එක් පාඨය කියවා, ඒ ඇසුරින් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල පිහිටුවීම මගින් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ලැබෙන අවස්ථා මෙන්ම ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පිළිබඳ පවතින වරණය පුළුල් කිරීමට ඉඩ ප්‍රස්තාව ලබා දේ. එසේම මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව ශ්‍රී ලංකාවේ පවතින තරගකාරී වාසි, එනම් විශේෂයෙන් රටෙහි උපාය මාර්ගික පිහිටීම, ශ්‍රම බලකායේ සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින ධනාත්මක ස්වභාවය සහ දේශීය අධ්‍යයන කාර්ය මණ්ඩලවල පවතින බුද්ධිමය කුසලතා වැනි තරගකාරී වාසි මගින් ඔප් නැංවී ඇත. එම නිසා මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවට විදේශීය උසස් අධ්‍යාපන ආයතනවලට සමාන මට්ටමකින් අඩු පිරිවැයක් යටතේ සේවා සැපයීමට හැකියාව ලැබෙන අතර, එමගින් උසස් අධ්‍යාපන සේවා අපනයනය කිරීමට ද නුදුරු අනාගතයේදී අවස්ථාව සැලසෙනු ඇත. පසුගිය කාලයේදී උසස් අධ්‍යාපනය සඳහා වන ආයෝජන සීමා කොට තිබුණු නිසා මෙම නව ප්‍රතිපත්තිය මගින් අධ්‍යාපන අංශයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු මෙන්ම අධ්‍යයන කාර්ය මණ්ඩලවල කුසලතා ඔප් නැංවීමට ද ඉඩ සැලසෙනු ඇත. එසේම, මෙම මුලපිරීම මගින් උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය සම්පත් ක්ෂණිකව කාර්යක්ෂම ලෙස යොදා ගැනීමක් සිදු වන අතර, එය විශ්ව විද්‍යාල අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩි කිරීමට ඇති තරගකාරිත්වය ඉහළ යාමට ද උපකාරී වනු ඇත. මෙම ඉහළ තරගකාරිත්වය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අනුබල දෙන අතර, දේශීය වෙළෙඳපොළෙහි ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර පවතින නොගැළපීම නිවැරදි කිරීමට ද උපකාරී වනු ඇත.

(අ) දේශීය ශ්‍රම වෙළෙඳපොළෙහි පවත්නා ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර පවතින නොගැළපීම නිවැරදි කිරීමට අදාළව එකිනෙකට තුඩුදෙන හේතු කිහිපයක් මෙම පාඨයෙහි අනුපිළිවෙළින් දක්වා ඇත. ඒවා නම් කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ආ) මෙම පාඨයේ දැක්වෙන පරිදි රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල ශ්‍රී ලංකාවේ පිහිටුවීමේ අවශ්‍යතාව සහ එම අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව තහවුරු කෙරෙන කරුණු මොනවා ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ඉ) විශ්ව විද්‍යාල අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අනුබල දෙන තරගකාරිත්වය ඉහළ නැංවීමට උපකාරී වන පූර්ව කරුණ කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ඊ) නුදුරු අනාගතයේදී උසස් අධ්‍යාපන සේවා අපනයනය කිරීමේ ප්‍රයත්නය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම පාඨයෙහි දක්වා ඇති උපාය මාර්ගය කවරේ ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(උ) මෙහි යෝජිත නව ප්‍රතිපත්තියට පෙර, අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙන්ම අධ්‍යාපන කාර්ය මණ්ඩල ඔප් නැංවීමට ද බාධා ඇති වූයේ කෙසේ ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

(ii) ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ දේශීය ආර්ථික වර්ධනය පිළිබඳව අපේක්ෂා රට තුළ වර්ධනයවීමත් සමග 2011 වසරේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි බලාපොරොත්තු වේ. වඩා වැඩි එකතු කළ වටිනාකමක් සහිත නිමි භාණ්ඩ අපනයනය නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් තුළට පිවිසීම සහ ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා තර කර ගැනීම වැනි කාරණා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් අපනයන භාණ්ඩ කලඹ විවිධාංගීකරණය කිරීම සහ අපනයන වෙළෙඳපොළවල් පුළුල් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග රැසක් දැනටමත් ගෙන තිබේ. තවද, රට තුළට විශාල වශයෙන් විදේශ විනිමය ආකර්ෂණය කර ගැනීම සඳහා සංචාරක ව්‍යාපාරය ප්‍රචලිත කිරීමටත් විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමටත් පියවර ගෙන ඇත. වෙළෙඳ භාණ්ඩවල අනපේක්ෂිත මිල උච්චාවචන සහ කෙටිකාලීන මූල්‍ය ප්‍රවාහ අනපේක්ෂිත ලෙස චලනයවීම වැනි බාහිර කම්පනයන්ට මුහුණ දිය හැකි පරිදි ගෙවුම් තුලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂිත පියවර ක්‍රියාත්මක කළ යුතුය.

(අ) බාහිර කම්පනයන්හි විද්‍යමාන වන්නාවූ පොදු ලක්ෂණ කවරේ ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ආ) 2011 වසරේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත් කිරීමේ බලාපොරොත්තුව මල්පල ගැන්වීමට අදාළව මෙහි දැක්වෙන පූර්ව අවශ්‍යතා මොනවා ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

[ 7 වන පිටුව බලන්න.

(ඉ) සංචාරක ව්‍යාපාරය ප්‍රචලිත කිරීම සහ විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම මගින් අපේක්ෂිත අරමුණ කුමක් ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

(ඊ) ගෙවුම් තුලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂිත පියවර ක්‍රියාත්මක කළයුතු වන්නේ කෙබඳු ආකාරයෙන් ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

(උ) අපනයන භාණ්ඩ කලඹ විවිධාංගීකරණය සහ අපනයන වෙළෙඳපොළවල් පුළුල් කිරීම සඳහා යෙදූ විවිධ ක්‍රියාමාර්ගවලදී වැඩි අවධානයක් යොමු වූයේ කවර කරුණු කෙරෙහි ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

(iii) ශ්‍රී ලංකාවේ උප රාජ්‍ය ආයතන පද්ධතිය පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් සමන්විත වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යටතේ පළාත් සභා 9 ක් පිහිටුවා ඇති අතර පළාත් පාලන ආයතන පද්ධතිය ආයතන 335 කින් සමන්විත වේ. 2013 වසර අවසානය වනවිට පළාත් පාලන ආයතන පද්ධතිය මහ නගර සභා 23 කින්, නගර සභා 41 කින් සහ ප්‍රාදේශීය සභා 271 කින් සමන්විත විය.

2013 වසරේ දී උප රාජ්‍ය මට්ටමේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය සුවිශේෂ කාර්යභාරයක් සිදු කරන ලදි. පළාත් සභා සහ පළාත් පාලන මට්ටමේ පවතින සංවර්ධන අවශ්‍යතාවන් හඳුනා ගැනීමත් ආධාර සපයන ආයතන සමග ඵලදායීව සමායෝජනය සිදුකිරීම මගින් ආයෝජන වැඩපිළිවෙළට පහසුකම් සැලසීමත් සඳහා අමාත්‍යාංශය උප රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් සමග ක්‍රියාකාරී ලෙස අඛණ්ඩව වැඩ කටයුතු සිදු කරන ලදි. තවද, මහජනතාවට වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා යටිතල පහසුකම් සහ කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීමට පියවර ගන්නා ලදි. මහජනතාවගේ කාලීන ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීමටත් වඩා යහපත් සේවාවක් සැපයීම සඳහාත් අමාත්‍යාංශය විවිධ වැඩසටහන් ගණනාවක් ආරම්භ කරන ලදි. ඒ අනුව, අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය මගින් කසළ කළමනාකරණ සහ ඩෙංගු මර්දන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. "කාර්යක්ෂම සේවාවක් තුළින් සමෘද්ධිමත් හෙට දවසක්" යන තේමාව යටතේ පළාත් පාලන සතියක් 2013 වසරේ දී පවත්වන ලදි.

(අ) මහජනතාවගේ කාලීන ප්‍රශ්න විසඳීමත් වඩා යහපත් සේවයක් සැලසීමත් උදෙසා අමාත්‍යාංශය යෙදූ උපායමාර්ගය කවරේ ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

[ 8 වන පිටුව බලන්න.

(ආ) 2013 වසර අවසානයේ දී ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධති ව්‍යුහය කවර අංශවලින් සමන්විත වී ඇයි දක්වන්න.

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

(ඉ) අමාත්‍යාංශය මගින් ආරම්භ කරනු ලැබූ විවිධ වැඩසටහන් මොනවා ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

(ඊ) උප රාජ්‍ය ආයතන ප්‍රධානීන් සමග අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කළේ කවර අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

(උ) මෙම පාඨයේ දැක්වෙන පරිදි "ආයෝජන වැඩපිළිවෙළට පහසුකම් සැලසීම" අපේක්ෂිත ප්‍රතිඵලය නම්, ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ගය කුමක් ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

* * *